Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2024), Vol. 09 (02)

# A Hegemonic Study on Youth Problems Appeared in Modern Sinhala Poetry (From The 1970s to Present)

K. Eranda
Postgraduate Institute of Humanities and Social Science, University of Peradeniya, Sri Lanka

**Article Info**

Article History:
Received 15 Feb 2024
Accepted 28 Aug 2024
Issue Published Online
01 July 2024

**Key Words:**
Youth
Problems
Poem
Hegemony
Ideology

*Corresponding author
E-mail address:
kalpaeranda@ymail.com

https://orcid.org/0009-0007-8229-6632

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v09i02.12

VJHSS (2024), Vol. 09 (02), pp. 179-195

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2024

## ABSTRACT

*The purpose of this research is to study the nature of youth through the concept of hegemony and investigate how it is portrayed in modern Sinhala poetry. Poetry is one of highly sensitive art medium than other literary media, hence, this study is mainly focused on qualitatively analyzing "the youth" social, economic, and political context that appeared in Sinhala poetry which was published from the 1970s to the present with the hegemonic point of view. As the primary data, selected printed Sinhala poems (from 1970-to present) were used while collected data were analyzed qualitatively according to Hegemony concept. To study the youth issues depicted in poetry, 'Hegemony' was used as the theoretical framework that was introduced by Antonio Gramsci. Hegemony is a concept developed by Marxism which can be explained as "ruling by will". Social, economic, and political factors have affected the youth in an ideological way. The reason the poem portrays the effect of this ideological state apparatus is as a release of emotional pressure or unrest in the youth which depicts the feelings of the youth. In this study, youth problems are identified through hegemony, repression and youth unrest, cultural hegemony and education, counter-hegemony and sexuality, popular culture and youth. This research reveals that youth issues are more ideological than superficial. Thus, it can be concluded that the influence of the ideological state apparatus has affected the youth of Sri Lanka. The social, economic and political factors that influenced youth are depicted in the poems had more emotional sense.*

**මාතෘකාව**

නූතන සිංහල කාව්‍ය නිර්මාණවල නිරූපිත තාරුණ්‍යය පිළිබඳ හෙජමොනික අධ්‍යයනයක් (1970 සිට වර්තමානය තෙක්)

## 1. හැඳින්වීම

තාරුණ්‍යය යන සංකල්පය නිර්වචනය කිරීම අපහසු දෙයක් ලෙස සැලකිය හැකි ය. Pierre Bourdieu (1978) තාරුණ්‍යය යනු වචනයක් පමණක් බවත් එය පරිණාමය වෙමින් පවතින සංකල්පයක් බවත් යෝජනා කළේ ය (Jones, 2009). තාරුණ්‍යය ඇතැමුන්ට, විශේෂයෙන් බටහිර සමාජවල ළමා කාලය සහ වැඩිහිටිභාවය අතර ජීවන අවධීන් ලෙසත්, යැපීමෙන් ස්වාධීන වීම ලෙසත් අර්ථ දැක්විය හැකි ය (Kehily, 2007). ඇතැමුන් ජීව විද්‍යාත්මක සලකුණුවලට කැමැත්තක් දක්වන අතර, යෞවනය යනු වැඩිවිය පැමිණීම සහ මාපියන් අතර කාල පරිච්ඡේදය වන අතර තවත් සමහරුන් සංස්කෘතික සලකුණු අනුව තාරුණ්‍යය නිර්වචනය කරන්නේ විශේෂිත භූමිකාවන්, චාරිත්‍ර වාරිත්‍ර සහ සම්බන්ධතා සහිත විශේෂිත සමාජ තත්ත්වයක් බවත් සලකමිනි.

නූතන සිංහල කාව්‍ය පරපුර ඇරඹෙන්නේ නිසඳැස් කාව්‍ය යුගයෙන් පසු ආරම්භ වූ 1970 දශකයේ ය. මෙකී කාව්‍ය පරපුරට ප්‍රධාන වශයෙන් වස්තු වූයේ තත් යුගයේ පැවති ද්‍රව්‍යමය ප්‍රශ්න ය. එදා මෙදා තුර දශක පහක් ඉක්ම වූ කාලයක් මෙකී කාව්‍ය පරපුර නියෝජනය කරයි. 1970 ආරම්භයත් සමඟ නූතන තරුණ පරපුර නියෝජනය කරන්නේ යාන්ත්‍රික යුගයකි. මෙකී යුගයේ රචිත කාව්‍ය නිර්මාණවලින් ද ප්‍රකට වන්නේ එකී යාන්ත්‍රික යුගයක නියෝජනය වන අත්දැකීම් ය. ඇතැම් විට ඒවා 1970 දශකයේ ආරම්භ වූ ඒවා වුව ද එය කාලානුරූප ව ප්‍රකට වන්නේ නවමු ලෙසකිනි. පසෙකින් එම කාලයේ නව පරම්පරාවක් ගොඩනැගී ඇති අතර 1970 දශකයේ ජීවත් වූවන්ගේ දූ පුත්තු අද්‍යතනය නියෝජනය කරති.

1971 ඇති වූ තරුණ කැරැල්ලත් 1977 ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් මෑත කාලීන සමාජ විපර්යාසයට තුඩු දුන් මූල සාධක ය. එසේ ම 1983 ඇති වූ කළු ජූලිය හා දශක තුනක් පුරා පැවති ජනවාර්ගික අර්බුදයත් 1989 නැවත ආයුධ සන්නද්ධ තරුණයින්ගේ නැගී සිටීමත් කැපී පෙනෙයි. එසේ ම 2022 ඇති වූ ජනතා නැගීසිටීම සහ අරගලය ද මෙහි ලා වෙසෙස් තැනක් දරන අතර අරගලයේ උච්චාවස්ථා වර්තමානයේ ද දක්නට හැකි ය.

අද්‍යතන තරුණ ප්‍රශ්න ආකස්මික ව නිර්මාණය වූවක් නො ව 1970 දශකයේ සිට ඇති වූ සමාජ ප්‍රවණතාවල දිගුවක්, විපර්යාසයක්, සංකීර්ණතාවක් ලෙස මෙන් ම ස්වායත්ත ප්‍රවණතාවක් ලෙස ද හඳුනා ගත හැකි ය. මේ තරුණ ප්‍රශ්න සඳහා බලපෑ සමාජ, ආර්ථික, දේශපාලන සාධක සමකාලීන සිංහල කාව්‍ය නිර්මාණවල නිරූපණය වන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයේ අපේක්ෂිතාර්ථය යි.

### 1.1 පර්යේෂණ අරමුණු

කවිය නමැති ශානරයෙහි කාලීන වැදගත්කමක් ලෙස තාරුණ්‍යය විෂය කරගත් කාව්‍ය නිර්මාණවලට හිමි වෙයි. මේ පර්යේෂණයේ අපේක්ෂිතාර්ථය වන්නේ හෙජමොනිය නමැති සමාජ න්‍යායික සන්දර්භය තුළ තාරුණ්‍යයේ ප්‍රතිචාර හඳුනා ගැනීමත් එම ප්‍රතිචාරවල යථා ස්වභාවය අධ්‍යයනය කිරීම සහ එය සිංහල කවියෙහි නිරූපණය වන්නේ කවරාකාරයෙන් ද යන්න විමර්ශනය කිරීම යි.

### 1.2 සාහිත්‍ය විමර්ශනය

තාරුණ්‍යය විෂය කරගත් සමාජ විද්‍යාත්මක හා දේශපාලන සාහිත්‍ය විමර්ශන රැසක් හමුවේ. වික්ටර් අයිවන්ගේ *ප්‍රචණ්ඩත්වයේ අවිහිංසාව හා විප්ලවය* (1993) 1971 සහ 1989 ලාංකේය සමාජයේ ඇති වූ තරුණ නැගී සිටීම සාකච්ඡා කරයි. එම තොරතුරු තත්කාලීන තාරුණ්‍යය කෙරෙහි බල පෑ සමාජ දේශපාලන පරිසරය පිළිබඳ රචිත වෙනත් මූලාශ්‍රය හා සන්සන්දනය කරමින් තොරතුරු ගවේෂණය කෙරෙයි. එමගින් තත් යුගයේ තාරුණ්‍යය හැසිරුණු ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් බැලීමට පිටුබලයක් වුව ද ඒ පිළිබඳ පෘථුල අවධානයක් යොමු කර නැත. තාරුණ්‍යයට අදාළ හැසිරීම් රටාව කායික සහ මානසික වශයෙන් හඳුනා ගැනීමට සිග්මන් ෆ්‍රොයිඩ්ගේ (Sigmund Freud) *Beyond the pleasure principle* (1920) නමැති කෘතිය ඉවහල් විය. එහෙත් අපගේ පර්යේෂණය මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් නො ව හෙජමොනික අධ්‍යයනයක් වන බැවින් තාරුණ්‍යය හැසිරෙන ආකාරය හඳුනා ගැන්මට තත් කෘතිය වහල් කොට ගන්නා ලදි. ඩේවිඩ් කුමාරගේ *තරුණ උගතුන්ගේ දේශපාලනය* (1974) කෘතියෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන විෂමතා සහ රැකියා වියුක්තිය පිළිබඳ සාකච්ඡා කෙරෙයි. මෙහි දී ලාංකේය තරුණ ප්‍රශ්නවල ප්‍රාමාණික විමසුමක් සිදු නො කරයි. සම්පත් ආරියසේනගේ *80 දශකයේ සිංහල තරුණ කැරැල්ලේ ප්‍රචණ්ඩ පසුබිම* (2000) කෘතියෙන් 1989 රාජ්‍ය විරෝධී කැරැල්ල සහ ග්‍රාමීය තරුණයින්ගේ නැගී සිටීම පිළිබඳ සාකච්ඡා කෙරෙයි. එහි දත්ත 1989 තරුණ පුපුරා යාමට පසුබිම් සැකසුණු අකාරය පිළිබඳ හඳුනා ගැන්මට ඉවහල් වෙයි. ඩබ්ලිව්.පී.පී. ජයවර්ධනගේ *අඩසියවසක දේශපාලන සටහන්* (1999) නමැති කෘතියෙන් ද 1983 කළු ජූලිය සහ 1987 - 1989 කැරැල්ල පිළිබඳ කතිකා කෙරෙයි. එහෙත් අපගේ අධ්‍යාශය වන්නේ මෙකී තරුණ ප්‍රශ්න හෙජමොනික දෘෂ්ටියෙන් විග්‍රහ කිරීම යි. එසේ ම කුමාරි ජයවර්ධනගේ *1975 - 85 දශක තුළ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී වාදය* (1986) නමැති කෘතියෙන් ස්ත්‍රී දූෂණ, ජන මාධ්‍යවල ලිංගිකවාදය ආදි විෂය කෙරෙහි වඩාත් නම්‍ය වී ඇත. තාරුණ්‍යය කෙරෙහි අධ්‍යයනයේ දී තරුණිය සහ ලිංගිකත්වය යන විෂය සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් ගවේෂණය කළ ද අපගේ විග්‍රහය මෙය නූතන සිංහල කවියෙහි

නිරූපණය වන්නේ කෙසේ ද යන්න යි. එසේ ම රාජ්‍ය ප්‍රකාශන අතර *තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව - 1 වැනි සැසි වාර්තාව* (1990) ඇසුරෙන් අධ්‍යාපනය සහ සේවා නියුක්තිය අතර ඇති ගතිකය සංඛ්‍යාලේඛන සහිත ව විග්‍රහ කරයි. මෙමගින් තරුණ ප්‍රශ්න සියල්ල හඳුනාගෙන නොමැති බව දිස්වේ. මේ පර්යේෂණ හා වාර්තා කවිය හා ඍජු සබඳතාවක් නැත. මෙහි දී අපගේ යත්නය වන්නේ මෙකී තාරුණ්‍යය හා බැඳි ප්‍රශ්න නූතන සිංහල කවියෙහි විවිධාකාරයෙන් නිරූපණය වන්නේ කෙසේ ද යන්න හඳුනා ගැනීම යි.

අපගේ විග්‍රහය සඳහා තෝරා ගනු ලබන්නේ හෙජමොනිය නමැති සංකල්පය වන බැවින් ඒ සඳහා අප විසින් මූලික වශයෙන් අධ්‍යයනය කරනු ලබන්නේ හෙජමොනිය හඳුන්වා දුන් අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ (Antonio Gramsci) *Selections from the Prison Notebooks* (1971) නමැති කෘතිය යි. මෙහි දී හෙජමොනිය යන්න කවරේ ද? එය මාක්ස්වාදය අභිසංවර්ධනය කළ සංකල්පයක් බව හඳුනා ගැනෙයි. දේශපාලනය, රාජ්‍යය යන සංකල්ප ඇසුරෙන් තාරුණ්‍යයට ඒ ප්‍රපංචයන් බලපෑම් කරන ආකාරය හඳුනා ගැන්මට එය පිටුබලයක් වන මුත් අපගේ අධ්‍යාශය එමගින් නූතන තරුණ ප්‍රශ්න කවියෙහි නිරූපණය වන්නෙ‍ෙ කෙසේ ද යන්න හඳුනා ගැනීම යි. එසේ ම ලුයී අල්තුසර් (Louis Althusser) විසින් රචනා කරන ලද *Lenin and Philosophy and Other Essays* (1971) නමැති කෘතිය ග්‍රාම්ස්චි විසින් හඳුන්වා දෙන ලද හෙජමොනිය නමැති සංකල්පය දෘෂ්ටිවාදී තලයක පිහිටා නව මානයකින් බලයි. ඒ දෘෂ්ටිය අපගේ නිගමනය සඳහා වූ දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය හඳුනා ගැන්මට පිටුබලයකි. මෙහෙයින් මේ පර්යේෂණය සඳහා හෙජමොනිය නමැති සංකල්පය භාවිත කරනු ලබන්නේ නූතන සිංහල කවියෙහි නිරූපිත තාරුණ්‍යය හඳුනා ගැනීමට ය.

### 1.3 පර්යේෂණ ගැටලුව

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ සිංහල කාව්‍ය නිර්මාණවල නිරූපිත තාරුණ්‍යය 1970 සිට වර්තමානය තෙක් සමාජ, ආර්ථික, දේශපාලනික විපර්යාස සමග සම්බන්ධ වූ ආකාරය හෙජමොනික සන්දර්භීය එළඹුමකින් පරීක්ෂා කරළ හැක්කේ කවරාකාරයෙන් ද? යන්න යි.

### 1.4 උපන්‍යාසය

කේන්ද්‍රීය හෙජමොනික සංකල්පයෙහි නිරූපිත ආධිපත්‍යය සහ මර්දක තන්ත්‍රය, සංස්කෘතික හෙජමොනිය, ප්‍රති හෙජමොනිය, ජනප්‍රිය සංස්කෘතිය යන ඒවා සමාජ, ආර්ථික, දේශපාලන සාධක 1970 දශකයෙන් මෙපිට ඇති වූ තාරුණ්‍ය සඳහා මානව ධාර්මික, ආචාර ධාර්මික සහ දෘෂ්ටිවාදී වශයෙන් බලපෑ අතර එයින් සිංහල කවීන්ගේ සමාජ නිරීක්ෂණ තරුණ ප්‍රශ්න කෙරෙහි වැඩි සංවේදීතාවක් ඇති කළේ ය. වර්තමානයේ පවතින ඇතැම් තරුණ ප්‍රශ්න ආකස්මික ව නිර්මාණය වූවක් නො ව එය 1970 දශකයේ සිට ඇති වූ සමාජ ප්‍රවණතාවල දිගුවකි. ඇතැම් තරුණ ප්‍රශ්න වඩාත් සංකීර්ණ, විකෘති මුහුණුවරකින් පෙනී සිටියි. අද්‍යතන සමාජ සංකීර්ණතා අභිමුව තරුණයින්ගේ මානසික පීඩනය, ජනප්‍රිය සංස්කෘතියට ප්‍රතිචාර දක්වන චර්යා, තාක්ෂණය හේතුවෙන් සංකෝචනය වන තරුණ ජීවිත ආදි විවිධ මුහුණුවර ගත් තරුණ ප්‍රශ්නාවලියක් ගොඩනැගී ඇත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙකී පර්යේෂණය සිදු කිරීමේ දී තෝරා ගනු ලබන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යි. මේ පර්යේෂණය සාහිත්‍ය සමාජ විද්‍යානුගත පර්යේෂණයක් බැවින් සමාජබද්ධ කරුණු සමග උපයුක්ත සාහිත්‍ය කෘති විමර්ශනයට බඳුන් කෙරෙයි. එනම් සමාජ, ආර්ථික සහ දේශපාලනික විමර්ශනයක් මෙහි දී සිදුකෙරෙයි. මෙහි දී භාවිත කරන මූලික න්‍යාය වන්නේ හෙජමොනිය යි. මෙහි දී කාල් මාක්ස් ඉදිරිපත් කළ මාක්ස්වාදය අභිවර්ධනය කළ අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ හෙජමොනිය (Hegemony) නමැති සංකල්පය මත හිඳ මෙකී පර්යේෂණය සිදු කෙරෙයි.

අන්තෝනියෝ ග්‍රාම්ස්චි දේශපාලන සමාජය, සිවිල් සමාජය, රාජ්‍ය තන්ත්‍රය, පන්ති අරගලය, ජනප්‍රිය සංස්කෘතිය, ෆැසිස්ට් සමාජය, ජාතිකත්වය ආදි විවිධ විෂයයන් හෙජමොනිය ඇසුරෙන් විග්‍රහ කළේ ය. වසර එකොළහක් සිරගත ව සිටි කාලයෙහි ඔහු *Prison Notebooks* නමැති කෘතිය රචනා කළේ ය. ආධිපත්‍යය හෙවත් හෙජමොනිය (Hegemony) පිළිබඳ න්‍යාය ග්‍රාම්ස්චිගේ චින්තනයේ ඉතා නවීන වූත් පොහොසත් වූත් අංගය වේ. ග්‍රාම්ස්චි විසින් සංකල්පනය කරනු ලබන පාලන මාධ්‍ය දෙකක් ඇත. එනම් මර්දක තන්ත්‍රය සහ ආධිපත්‍යය වශයෙනි. මර්දක තන්ත්‍රය වශයෙන් හඳුනා ගන්නේ පාලක පන්තියකට විශාල පරිමාණයේ මර්දනයකින් දිගු කලක් පාලනය කරන්නට සිදුවීම යි. එය, එම පාලක පන්තියේ දුර්වලත්වය සංකේත කරන්නකි (ගුණසිංහ, 1986). බලහත්කාරයෙන් ආධිපත්‍යය පැතිරවීම වෙනුවට සූක්ෂ්ම ලෙස සමාජ සම්මුතිය ලබාගැනීමෙන් ආධිපත්‍යය සංස්ථාපිත කිරීම හෙජමොනියෙහි ලක්ෂණය යි. ඔහු මෙය විග්‍රහ කරන්නේ පුද්ගල මට්ටමෙන් නො ව සමාජ මට්ටමෙනි.

හෙජමොනිය නමැති සංකල්පයේ තවදු දිශානතියක් ලෙස දෘෂ්ටිවාදය සහ රාජ්‍ය යාන්ත්‍රණය වැදගත් වෙයි. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායට ලුවී අල්තුසර් කළ එකතුව නම් 'දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය' නම් සංකල්පය හඳුන්වා දීම යි. මේ පිළිබඳ අල්තුසර් ලියා ඇති න්‍යායික රචනා පළ වූයේ 1971 දී ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලද 1969

දී ප්‍රංශ භාෂාවෙන් මුලින් පළ වූ *ලෙනින් සහ දර්ශනවාදය* (*Lenin and Philosophy*) නම් වූ ග්‍රන්ථයේ ය.

අල්තුසර්ගේ මතවාදයට අනුව දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය මර්දනකාරී රාජ්‍ය යාන්ත්‍රණයෙන් වෙන්කොට හඳුනාගත යුතු ය. මර්දනකාරී රාජ්‍ය යාන්ත්‍රණයට අයත් වන්නේ පොලිසිය, යුදහමුදාව, සිරගෙවල්, උසාවිය යනාදි බලහත්කාරී හා මර්දනකාරී බලය සමාජය මත පවත්වාගෙන යන ආයතන යි. මතවාදී රාජ්‍ය යන්ත්‍රණයට අයත් දෘෂ්ටිවාදී ආයතන වන්නේ ආගමික, අධ්‍යාපන, පවුල, නෛතික, දේශපාලන ව්‍යාපාරික සන්නිවේදන සංස්කෘතික දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණ ය. මේ යාන්ත්‍රණ සමකාලීන තරුණ ප්‍රශ්න කෙරෙහි කවරාකාරයෙන් බලපාන්නේ ද යන්න සහ තත් යුගයේ කාව්‍ය නිර්මාණවලින් එය කෙසේ නිරූපණය වන්නේ දැයි මෙයින් විග්‍රහ කරගනු ලැබේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ආධිපත්‍යය, මර්දක තන්ත්‍රය සහ තරුණ අසහනය විෂය කරගත් සිංහල කාව්‍ය නිර්මාණ

### 3.1.1 ආධිපත්‍යය සහ මර්දක තන්ත්‍රය

ග්‍රාම්ස්චිගේ හෙජමොනියෙහි මූලික සංකල්ප අතර ආධිපත්‍යය සහ මර්දක තන්ත්‍රය වැදගත් තැනක් දරයි. පාලනය කිරීම නැතහොත් නායකත්වය පිහිටුවීම යන්න කිසිදු දේශපාලන සමාජයක මර්දනයෙන් පමණක් කළ හැක්කක් නො වේ. මතවාදී ආකාරයෙන් විවිධ පන්ති, සමාජ ස්තර හා ශ්‍රේණීන් තම මතය දිනා ගැනීමට ඕනෑම රජයක් හෝ පාලක පන්තියක් අත්‍යවශ්‍යයෙන් ම කළ යුත්තකි. ඇතැම් රාජ්‍යයන්හි මෙසේ මතවාදී ලෙස දිනාගැනීම විශාල පරිමාණයකිනුත්, මර්දනය සුළු පරිමාණයකිනුත් සිදු වේ. එවැනි පාලන ක්‍රම ග්‍රාම්ස්චි ආධිපත්‍යය යොදා ගැනීමේ සංස්ථා වශයෙන් හඳුන්වා දෙයි. මෙසේ මහා පරිමාණ වශයෙන් පාලිත පිරිස් දිනාගැනීම සහ සුළු පරිමාණයෙන් මර්දනය යොදා ගැනීම ස්ථිරසාර පාලක පන්තියකගේ පාලන ක්‍රමය යි (Gramsci, 1970). එනමුත් කිසිදු රාජ්‍යයක් පාලනය කිරීම පරිපූර්ණ වශයෙන් ම මතවාදී දිනාගැනීමකින් හෝ පරිපූර්ණ වශයෙන් මර්දනය යෙදීමෙන් හෝ කළ නො හැකි ය. විවිධ නිශ්චිත අවස්ථාවල දේශපාලනමය තුලනයක් සඳහා දිනාගැනීම සහ මර්දනය කුමන අනුපාතයකින් යොදාගත යුතු ද යන්න පාලක පන්තිය තීරණය කළ යුත්තකි (Blyumin, 1957).

### 3.1.2 තරුණ අසහනය

තරුණයන් වශයෙන් ද විශේෂ වූ සාමාජික හා දේශපාලන කොටස් වශයෙන් ද ශ්‍රී ලංකාවේ එළි බැසීමට පටන් ගත්තේ 1960 දශකයෙහි මැද භාගයෙහි පමණ ය. මේ බලවේගයෙහි කලල ස්වරූපය 1960-1962 කාලය තුළ දී විශ්වවිද්‍යාලවල දක්නට ලැබුණත්, 1965 ට ප්‍රථම ස්වාධීන තරුණ දේශපාලනයක් මෙරටෙහි නො වී ය. මේ කාලය තුළ දී විශ්වවිද්‍යාල හා තරුණ දේශපාලන ව්‍යාපාර ජාතික පක්ෂයන්හි දේශපාලනය විසින් සීමාකර තිබිණ. එක ම වෙනස වූයේ ඒ ඒ විශ්වවිද්‍යාලයෙහි, ප්‍රදේශයෙහි හෝ තරුණ සංවිධානයෙහි විශේෂ තත්ත්වයන්ට අනුව මේ දේශපාලනය හැඩගැසීම යි. තරුණ කොටස්වල ආවේණික සටන්කාමී බවෙන් ඔප් නැගුණ ද මේ කාලයෙහි තරුණයන් විසින් ඉදිරිපත් කරන ලද්දේ ඒ ඒ පංතිවල සටන් පාඨ ම ය. එහෙත් 1965න් පසු තරුණ කොටස්වලට සම්බන්ධ විශේෂ සටන් පාඨ ඉදිරිපත් කරනු ලැබුවා පමණක් නො ව, ජාතික දේශපාලන පක්ෂයන්හි චින්තනයෙන් පරිබාහිර දේශපාලන සංවිධාන පිහිටුවා ගැනීම ද සිදුවිය. මේ වර්ගයට අයත් සමහර තරංග මාලා පසු කලක ජනතා විමුක්ති පෙරමුණ පිහිටුවීමට එක් වූ අතර, තවත් සමහර ඒවා ස්වාධීන ව විකාශනය විය (කුමාර, 1974).

රාජ්‍ය මට්ටමින් ප්‍රචණ්ඩත්වයේ නො වැළැක්විය හැකි බව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වයට ඓතිහාසික හා වර්තමාන හේතු විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය ය. ෆ්‍රොයිඩ් විසින් නිර්වචනය කරන ලද පරිදි ප්‍රචණ්ඩත්වය මානව වර්ගයාගේ ප්‍රාථමික ස්වභාවයේ කොටසක් බව පැහැදිලි ය. මානව වර්ගයා යනු ආක්‍රමණශීලිත්වයේ ප්‍රබල කොටසක් ලෙස සැලකිය යුතු සහජ දායාද අතර සිටින ජීවීන් වේ. ප්‍රචණ්ඩත්වයට හේතු පිළිබඳ විවිධ න්‍යායන් තිබුණ ද එහි මූලය නැවත පැමිණෙන්නේ භීතිය, පලිගැනීම් හෝ ස්වභාවධර්මය යි. ප්‍රචණ්ඩත්වය මානව සබඳතාවල නො වැළැක්විය හැකි ලක්ෂණයක් වීම තහවුරු කිරීමට හෝ බැහැර කිරීමට අපහසු ය (Freud, 1920).

1971 තරුණ කැරැල්ලට සම්බන්ධ වූවන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් දුප්පත් හා පහළ මධ්‍යම පාන්තික පවුල්වලින් පැවත ආ ගම්බද තරුණයින් වූ බව පෙනේ. මෙකී කැරැල්ලේ තරුණ තරුණියන් අතර සිටි විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා විශාල නො වුව ද කැරැල්ලේ ප්‍රධාන නායකත්වය නියෝජනය කළෝ මොවුහු ය. තිබෙන ප්‍රශ්නවලට විසඳුමක් ලබා ගැනීමේ ප්‍රචණ්ඩ විප්ලවයක අවශ්‍යතාව තේරුම් ගනිමින් එම පණිවුඩය ගම්බද තරුණ තරුණියන් අතරට ගෙන ගියෝ ද ඔවුහු ය. එයින් පසු විවෘත ආර්ථිකයත් සමඟ විරැකියාවෙන් පෙළෙන ඉහළ සමාජ අපේක්ෂාවෙන් යුතු විශාල ග්‍රාමීය තරුණ සමාජ ස්තරයක් මතු ව ආවේ ය. අසහනයට පත් මෙකී තරුණ පිරිසෙහි බහුතරයක් 1989 රාජ්‍ය විරෝධී කැරැල්ලට සහභාගී වූහ. කැරැල්ලේ දී පුද්ගල ජීවිත හතළිස් දහසක් පමණ විනාශයට පත් වූ බැව් කියැවේ. එනමුදු මේ හා සබැඳි ව පරීක්ෂා කිරීම සඳහා පැමිණි යුරෝපීය පාර්ලිමේන්තු කණ්ඩායම

පවසා සිටියේ හැට දහසකට අධික තරුණයින් පිරිසක් මේ කැරලිකාර තත්ත්වයෙහි මියගොස් ඇති බව ය (ආරියසේන, 2000). මෙකී සමාජ ආලෝලනයන් ද තරුණ අසහනයට හේතුකාරක විය.

ශ්‍රී ලංකාවේ රැඩිකල් සිංහල ගැමි තරුණ පරපුර ආයුධ සන්නද්ධ අරගලයක් මගින් බලය ලබා ගැනීමට අවස්ථා දෙකක දී උත්සාහ දැරූ අතර එම අවස්ථා දෙක ම පරාජයෙන් කෙළවර වූයේ මර්දනය හේතුවෙනි. ඔවුන් එම අවස්ථා දෙකේ දී ම බලය අල්ලා ගැනීමට උත්සාහ දැරුවේ තමන් සාධාරණ යැයි සිතන නව සමාජයක් ගොඩනගා ගැනීමේ හොඳ අරමුණින් වන බවට ද නිසැක ය. ඔවුන් විසින් ඒ සඳහා එවැනි සාහසික ක්‍රියා මාර්ගයක් තෝරා ගන්නා ලද්දේ ද එවැනි හිංසාකාරී මාර්ගයක් හැර හිංසාකාරී නො වන වෙනත් මාර්ගයක් ඒ සඳහා ඇතැ යි නො සිතූ නිසා ය. සමාජ විපර්යාසයන් සඳහා වන දැනුවත් මැදිහත් වීමක් ප්‍රචණ්ඩකාරී වීම අත්‍යවශ්‍ය නැත. එහෙත් එසේ කළ හැක්කේ ප්‍රචණ්ඩ අරගලයකින් පමණකි ය යන්න රැඩිකල් සිංහල ගැමි තරුණ පරපුරේ විශ්වාසය විය. ඔවුහු තමන්ගේ වටිනා ජීවිත පරදුවට තබනවාට අතිරේක ව සමස්ත සමාජයේ ම පැවැත්ම පරදුවට තබා ක්‍රියා කරන මාර්ගයක් වෙත යොමු වුනේ ද ඒ හැර ඒ සඳහා වෙනත් මාවතක් නැති බවට ඔවුන් තුළ පැවති දැඩි විශ්වාසය හේතුකොට ගෙන ය. එහෙත් පැහැදිලි වශයෙන් ම එය මතවාදී මුලාවක් බව කිව යුතු ය. එම වැරදි නිගමනයට ඒමට ඔවුන් යොදා ගෙන තිබූ ප්‍රධාන තර්කය වූයේ ප්‍රචණ්ඩ බලය ම හැර වෙනත් මාවතක් නැති බව යි. මේ මුලාව මේ තරුණයින්ට පමණක් සීමා වී නැති බව ද කිව යුතු ය. සියලු වර්ගවලට අයත් මාක්ස්වාදීන් අතර පමණක් නො ව මාක්ස්වාදය ප්‍රතික්ෂේප කරන එහෙත් විප්ලවය පිළිගන්නා නිර්මාක්ස්වාදී උගතුන් අතර ද ඒ අරබයා එවැනි පිළිගැනීමක් පවතී (අයිවන්, 1993).

තත් යුගයේ ඇති වූ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිමෙහි ඇති වූ තරුණ අසහනයෙන් මිදීමට තරුණයෝ වැඩි වශයෙන් සමාජවාදී රාජ්‍යයන්හි ආලෝකය ලැබූහ. සෝවියට් රුසියාව, කියුබාව, වියට්නාමය ආදි රාජ්‍යයන් ඒ අතර වෙයි. එමග අනුදත් ඔවුහු අනුක්‍රමයෙන් නැඹුරු වූයේ විප්ලවය වෙත ය. මොනිකා රුවන්පතිරණගේ 'වියට්නාම් පොළොව' මෙහි ලා දෙස් දෙයි.

නිල් ගුවනේ නෙක ගී ගයනා සියොතුන්
වෙඩි හඬ මැද පිට සක්වල පියඹා ඇත
කඳු රැලි මැද ගලන සියලු ගංගාවල
නිල් දිය මත රතු පැහැයක් තැවරී ඇත
(රුවන්පතිරණ, 1972)

ගොවිපලේ ද මේ විප්ලවය මෙලෙසින් ම ක්‍රියාත්මක විය. එහෙත් එයට විරුද්ධ ව රාජ්‍ය මර්දනය ද එලෙසින් ම ක්‍රියාත්මක විය. අසහනයට පත් ග්‍රාමීය තරුණයා කුළ පීඩනයෙන් පෙළීම හේතුවෙන් මෙවන් විප්ලවකාරී මාවතකට පිවිසීම සිදුවිය. 'ගොවිපලේ විප්ලවය' නම් පැදි පෙළ මෙහි ලා දෙස් දෙයි.

පියස්සක් නැති ලොරියේ නැග
තෙරපෙමින් උරෙන් උර
අත් මුවහත් කරගෙන
ගියා කැලෑවට
සටනට (කොඩිතුවක්කු, 1975).

රාජ්‍යය පිළිබඳ සම්භාව්‍ය මාක්ස්වාදී න්‍යාය විමර්ශනය කරමින් අල්තුසර් පවසන්නේ රාජ්‍යය යන්න එහි සම්පූර්ණයෙන් ම සංකල්පගත කර තිබෙන්නේ මර්දනකාරී යන්ත්‍රණයක් (repressive apparatus) ලෙස ය. ඒ අනුව රාජ්‍යය යනු මර්දනයේ 'යන්ත්‍රණයකි'. දහනවවැනි සියවසේ සිට ධනේශ්වර සහ ඉඩම්හිමි පන්තීන්ගෙන් සමන්විත වූ පාලක පන්තීන්ට, කම්කරු පන්තිය මත සිය ආධිපත්‍යය පවත්වා ගැනීම සහතික කරන ලද්දේ එමගිනි. අතිරික්තය පැහැර ගැනීම සඳහා කම්කරු පන්තිය යටපත් කරගෙන පාලක පන්තියට එම හැකියාව ලබාදුන්නේ රාජ්‍යය නමැති මෙකී මර්දනයේ යාන්ත්‍රණය යි. (state apparatus) අල්තුසර් මෙහි දී පවසන දෙයක් නම් රාජ්‍යය පිළිබඳ මෙකී මාක්ස්වාදී න්‍යායේ එළැඹුම රාජ්‍යය පිළිබඳ 'විස්තරාත්මක න්‍යායක්' පමණක් බව යි. එය පරිපූර්ණ න්‍යායක් නො වේ. එය රාජ්‍යයේ කාර්යය පිළිබඳ ඉතා වැදගත් ආලෝක ධාරාවක් වුව ද එය සම්පූර්ණ න්‍යායක් බවට පත් කළ යුතු ය යන්න අල්තුසර්ගේ අදහස යි (Althusser, 1971).

රත්න ශ්‍රී විජේසිංහ විප්ලවීය අත්දැකීම් වුව ද සංයමයෙන් යුතු භාවික බස් වහරකින් රචනා කළ කවියෙකි. කැරැල්ලට බිය වූ තරුණයින්ට ධෛර්ය සම්ප්‍රයුක්ත බවක් එක් කළ එවන් පබැඳුමක් ලෙස 'අසිරිමත් ථෙර ගාථාව' නම් පද්‍යය දැක්විය හැකි ය.

තරුණ පක්ෂීනි වරෙල්ලා
නිකරුණේ හෙල්ල තුඩුවලට
බිලි නො වෙල්ලා
අනුන්ගේ කූඩුවල නවාතැන් නො ඉල්ලා
උඹලගෙ ම ගෙදරකට යමල්ලා (විජේසිංහ, 1985).

කිසිදු රාජ්‍යයක් පාලනය කිරීම පරිපූර්ණ වශයෙන් ම මතවාදී දිනාගැනීමකින් හෝ පරිපූර්ණ වශයෙන් මර්දනය යෙදීමෙන් හෝ කළ නො හැකි ය. විවිධ නිශ්චිත අවස්ථාවල දේශපාලනමය තුලනයක් සඳහා දිනාගැනීම සහ මර්දනය කුමන අනුපාතයකින් යොදාගත යුතු ද යන්න පාලක පන්තිය තීරණය කළ යුත්තකි (Blyumin, 1957). ග්‍රාම්ස්චි මර්දක තන්ත්‍රය ලෙස හඳුනාගන්නේ පාලක පන්තියකට විශාල පරිමානයේ මර්දනයකින් දිගු කලක් පාලනය කරන්නට සිදුවීම යි. එය එම පාලක පන්තියේ දුර්වලත්වය සංකේත කරන්නකි. මේ අනුව ඉතාමත්

ම අඩුවෙන් මර්දක බලය භාවිත කරනු ලබන්නේ දැඩි ආත්ම විශ්වාසයෙන් යුතු පාලක පන්තීන් විසිනි. ආත්ම විශ්වාසය හීන අප්‍රබුද්ධ පාලක පන්තීන් මර්දක තන්ත්‍රය යොදා ගන්නා අතර එයින් ම පැන නගින ප්‍රතිවිරෝධයන් විසින් තත් මර්දක තන්ත්‍රයත් පාලක පන්තියත් ජරාජීර්ණ ඉතිහාසය වෙත ගෙනෙනු ලබයි.

එහි අමානුෂිකත්වය කෙතරම් කෲරතර ද යන්න සිදු වූ තරුණ සංහාරය සාක්ෂි දරයි. හැට දහසක් පමණ තරුණ ජීවිත සංහාරයකින් අවසන් වූ දකුණේ සිවිල් යුද්ධය ලෙස හැඳින්විය හැකි 1989 කාලයේ පැවති සිංහල තරුණ කැරැල්ලේ නැගීමට ද දේශපාලන තීන්දු හේතු විය. නැවත වරක් සන්නද්ධ අරගලයකට මුලපිරූ ඔවුන් 1971 දී ප්‍රමාණවත් දේශපාලන දර්ශනයකින් තොර ව ඝාතන හා පහරදීම් කළ බව පෙනෙයි. ඔවුන්ට එරෙහි ව දියත් කළ රාජ්‍ය මර්දනය ද කෲරතර විය. මෙකී ක්‍රියා දෙස අද්‍යතන නිර්මාණකරුවා ද විමසිලිමත් විය. කුමාර හෙට්ටිආරච්චිගේ 'සීත ගඟුලේ කවිය' රාජ්‍ය මර්දනයේ කෲරතර ස්වභාව පසක්කොට දෙන්නකි.

ලොල්ල වඩන මිණි මාලය බෙල්ල වට ගොතා
දෑල්ල ගෙන කකා අරටුව සපා යුෂ බොතා
නිල්ල පිනි තබා ඉන වට සර්පයන් ඔතා
අල්ල ගෙන පුතා ගිනියම් තැල්ල පළඳතා
(හෙට්ටිආරච්චි, 1989)

මර්දනය හේතුවෙන් භෞතික ලෙසත් මර්දක රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාකරන අතර දෙවනුව දෘෂ්ටිවාදය හේතුවෙන් පිරිසිදු මර්දනකාරී රාජ්‍යයක් ලෙස ක්‍රියාත්මක වේ. නිදසුන් ලෙස යුදහමුදාව, පොලිසිය ක්‍රියාත්මක වන්නේ දෘෂ්ටිවාදයෙනි. මේ දෙකෙහි ම ඒකාබද්ධතාව ප්‍රතිනිෂ්පාදනය සඳහා බැඳී සිටී. දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය සුවිසල් ලෙස ක්‍රියාත්මක වන අතර එය වඩාත් ඉස්මතු වන්නේ දෘෂ්ටිවාදයෙනි.

තරුණ අසහනය අද්‍යතන කවීන්ට ද වස්තු විෂය වීමෙන් පෙනී යන්නේ එකී මතක ජන සමාජයේ තවමත් නිදන්ගත ව පවත්නා බව යි. එවනාහි තරුණ අහසනයෙහි පුපුරායාමක් මතු නො ව තවමත් එය තරුණ ප්‍රජාවෙහි දැල්වුණු අපේක්ෂාවක් වූ බව යි. එහෙත් අතීතයේ අඳුරු මතක ඔවුන්ගේ කවි සිත සසල කරයි. සෞම්‍ය සඳරුවන් ලියනගේ විසින් රචිත 'සෝයුරු හදක සටහන' මෙහි ලා සාක්ෂි දරයි.

සමනලුන් වෙඩි තබා මරා, පළහා කැව
නාස්පුඩු කකියවන පුළුටු ගඳ පිරි බිමක
නො පැයූ හිරුට පෙර නුඹ සොයා නගරයට
ධවල භීෂණ මැදින් ගියෙමු අපි උදයේ ම
(ලියනගේ, 2014)

තරුණ කිවියර සම්පත් කුරුප්පුආරච්චි රචනා කළ 'පස් කන්දක හුස්ම ගනිමි' නමැති කාව්‍ය කෘතියේ එනමින් ම හැඳින්වෙන කවි පෙළ ද භීෂණ සමයෙහි මියගිය සිය පුතු පිළිබඳ අතීත මතක තවමත් සිහි කරන නූතන මවකගේ සරයෙන් රචනා වූවකි.

හතරමං හන්දිය දිහාවෙන්
හතර පාරක් වෙඩි තියන හඬ
අදත් මහ රෑ අපේ අම්මට ඇහෙනවා
එකක් කළුවට, එකක් අමරෙට
අනෙක පොඩි අනුරගේ ඔළුවට
ඉතුරු එක මට, නොදක්කත් ඈ දන්නවා
එදා වාගෙම පුතේ ගාගෙන
කන්ද මුදුනට දුවනවා
(කුරුප්පුආරච්චි, 2015)

පාලන මාධ්‍යය වශයෙන් ආධිපත්‍යය යොදාගන්නා ප්‍රබුද්ධ පාලන ශ්‍රේණිවලට වුව ද යම් අර්බුද සමයන්හි මර්දනය යොදා ගැනීම අවශ්‍ය වේ. එලෙස මර්දනය යොදා ගැනීමේ දී කොන්දේසි දෙකක් සම්පූර්ණ විය යුතු ය. පළමුවැන්න පාලක ශ්‍රේණි මර්දන උපකරණ මත පරිපූර්ණ මතවාදී ආධිපත්‍යයක් පැවැත්විය යුතු අතර එම පරිපූර්ණ ආධිපත්‍යය මර්දන උපකරණවල විනයෙන් ප්‍රකාශ විය යුතු ය. දෙවැන්න මර්දනය සම්පූර්ණ සමාජ ව්‍යුහයේ ම පැතිර නො යෑමට පාලක ශ්‍රේණි වගබලාගත යුතු ය. එනම් මර්දනය කළ යුතු පිරිස් සාමාන්‍ය සමාජ ව්‍යුහයෙන් ඈත්කර මර්දනය කිරීමේ හැකියාව තිබිය යුතු ය. එසේ නොමැති ව සමස්ත මර්දනයක් ඇති වන්නේ නම් පාලිත කොට්ඨාස අතර නො සන්සුන්කමක් සහ කලකිරීමක් ඇති වේ. මේ විශ්වාසභංගවීම වූ කලි පාලක ශ්‍රේණි පාලිත පිරිස් මත පවත්වා ගතයුතු මතවාදී ආධිපත්‍යය ක්ෂය වී යෑම යි.

එම විශ්වාසය භංග වූ කල රාජ්‍යයට එරෙහි ව නැගී සිටින තරුණ ප්‍රජාව වෙත රාජ්‍යය විසින් මර්දනය දියත් කරනු ලබයි. 1989 අරගල සමයෙහි එසේ විප්ලවය පිළිබඳ කවි ලියූ කවියකු ලෙස චන්ද්‍රකුමාර වික්‍රමරත්න කැපී පෙනෙයි. 1991 වර්ෂයේ ද පුවත්පත්වලට කවි ලියූ ඔහු අනතුරු ව අතුරුදහන් වීම නිමිති කොටගෙන මාලතී කල්පනා ඇම්බ්‍රෝස් 'චන්දරේ' නමින් ඔහුගේ මතක අද්‍යතනයෙහි ද පුනර්නිර්මාණය කරයි.

ඉරක් නො නැගෙන අඳුරු යුගයක්
දඩ බිමක් වූ කළුවරේ
පන්හිඳට ජීවිතෙන් පණ දී
ලේ කඳුලු උඹ කවි කළේ
ගොදුරු හොයනා රුදුරු ගිනි අවි
මලක රතටයි ඉව කළේ
යදම් බිඳ ලූ පරපුරක් වෙත
උඹයි රණ ගී හුරු කළේ (ඇම්බ්‍රෝස්, 2016)

ජන අරගල ව්‍යාපාරය නිර්මාණය වීම එහි සන්ධිස්ථානමය අවස්ථාවක් වූ අතර ජාතිකවාදය හා සහාගවාදයට එරෙහි ව වමේ පරමාදර්ශ විශ්වාස

කරමින් දේශපාලනයේ නියැලි පක්ෂ, සංවිධාන හා පුද්ගලයන් සමග බුද්ධිමය හා ප්‍රායෝගික එක්සත් බවක් සඳහා නව අවකාශයක් ගොඩනැගුණු බවක් පෙනිණි. අඩුවැඩි වශයෙන් වර්තමානය දක්වා ම තීරණාත්මක මහජන පොදු අයිතිවාසිකම් අරගලයක වමේ පොදු සංවාදයක නියෝජනයක් පිළිබිඹු වුව ද සැබවින් ම විමුක්ති දේශපාලන කතිකාමය අවකාශයෙහි දක්නට ලැබෙන්නේ හැකිළුණු බවකි. එනම් පෙරටුගාමී වාම පාක්ෂිකත්වයේ අරගල භූමිකාව සාධනීය හා යුක්තිසහගත මැදිහත්වීමක් වන අතර ම එකී වාම දේශපාලන පෙරමුණ අභ්‍යන්තර සිරවීමකට ලක් ව තිබෙන බවක් පෙනෙයි. මෙයින් ගැලවිය හැකි මග වන්නේ පශ්චාත් මාක්ස්වාදයෙන් පිටුබලය ලද නව ප්‍රජාතාන්ත්‍රික දේශපාලනයකි. පශ්චාත් මාක්ස්වාදී කතිකාව පෙරටුගාමී වාම දේශපාලනය වෙත අභිමුඛ කෙරෙන්නේ හුදු වියුක්ත න්‍යායික මැදිහත්වීමක් ලෙස නො ව එකී වමේ දේශපාලනය මුහුණ දෙන සංයුක්ත ගැටලුවට අවශ්‍ය ප්‍රායෝගික විසඳුමක් ලෙස ය.

## 3.2 සංස්කෘතික හෙජමොනිය සහ අධ්‍යාපනය විෂය කරගත් සිංහල කාව්‍ය නිර්මාණ

### 3.2.1 සංස්කෘතික හෙජමොනිය

අන්තෝනියෝ ග්‍රාම්ස්චි හෙජමොනිය සංවර්ධනය කළ අවස්ථාවක් ලෙස සංස්කෘතික හෙජමොනිය හැඳින්විය හැකි ය. සංස්කෘතික හෙජමොනියෙහි බලය පවතින්නේ නො පෙනෙනතාව මත යි. සොල්දාදුවෙක් තුවක්කුවක් තබා ගැනීම, දේශපාලන පද්ධතිය පවත්වාගෙන යාමට ලියා ඇති ව්‍යවස්ථාව යන දේ භෞතිකමය වශයෙන් පෙනෙන දේ ය. එනමුදු සංස්කෘතිය තිබෙන්නේ අප අභ්‍යන්තරයේ ම ය. එය දේශපාලනික ලෙස නො පෙනේ. සංස්කෘතිය යනු දේශපාලනික වූවකි. එසේ වුවත් දේශපාලනික තත්ත්වය හඳුනා ගැනීම අසීරු වුවත් අපි එයට ප්‍රතිවිරුද්ධතාවක් නො දක්වමු. සංස්කෘතික හෙජමොනිය වනවිට බහුතරයකට එය සාමාන්‍ය දැනීමක් සේ වෙයි.

සංස්කෘතික හෙජමොනිය නමැති සංකල්පයෙන් දැක්වෙන්නේ බහුතරයේ අවශ්‍යතාව මත සැකසුණු සංස්කෘතියේ ප්‍රබලතාවෙහි ප්‍රමුඛතාව යි. එය ප්‍රබල සමාජීය පන්තියේ කැමැත්ත පෙන්වා දෙයි. මේ සංකල්පය ප්‍රමුඛ කණ්ඩායම් මගින් ඇති කරනු ලබන සමාජ ආයතනවලට කරන වෙනස්කම් සඳහා බලපායි. එම නිසා එය අනෙක් සමාජ කණ්ඩායම් කෙරෙහි විශ්වාසවලට, දැක්මට හා වටිනාකම්වලට සහභාගි වේ. එය නව්‍යතාවෙන් යුතු සමාජීය සංස්කෘතිය ලෙස වෙනත් ලෙසකින් පිළිගත හැකි සහ සාමාන්‍යකරණය කළ හැකි ය. මේ දේවල්වලින් බිහිවන සමාජීය, ආර්ථිකමය සහ දේශපාලනමය විශමතාවන්ගේ පිළිගැනීමට, සාමාන්‍යකරණයට එසේ පවතින සංස්කෘතික රාජ්‍යයන් යොමු කෙරේ. මේ සමාජීය ගොඩනැගීම් ස්වාභාවික සහ එලදායී විශාල ජනකායකට බලපෑ හැකි ය. එසේ ඵලදායී වන්නේ ප්‍රබල කණ්ඩායමට ඵලදායී වන්නේ නම් පමණි. විශාල ජනකායකට ඵලදායී වන්නේ එවිට ය.

### 3.2.2 අධ්‍යාපනය සහ තාරුණ්‍යය

නිදහස් අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ සමාජීය දෙයකට වඩා දේශපාලනික වූවකි. සර්වජන ඡන්ද බලය ලංකාවට ලැබුණේ ලංකාවේ මිනිසුන් ඒ සඳහා කළ අරගලයක ප්‍රතිඵලයක් ලෙස නො ව බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂයේ ප්‍රතිපත්තියක් ලෙස ය. ලංකාවේ ධනපති දේශපාලකයෝ සර්වජන ඡන්ද බලයට විරුද්ධ වූහ. මෝඩයින්ට ඡන්ද බලය දීම රටේ අනාගතයට අයහපත් දෙයක් ලෙස ඔවුහු තැකූහ. මෙකී ප්‍රකාශයට තත් යුගයේ ලංකාවේ සමසමාජ පක්ෂය සහ සෙසු වාමාංශික පක්ෂ තදින් විරුද්ධ වූහ. සර්වජන ඡන්දයට පසු ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ බටහිර අධ්‍යාපනය සමස්ත සමාජයට ම ලබා දීම යි. එතැන්හි දී ලාංකේය වාමාංශිකයින්ගේ මතය වූයේ නිර්ධන පන්තියට අයත් ළමුන් නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් ඉගෙන සමාජයට ආදරය කරන පිරිසක් බවට පත්වේ ය යන අදහස යි. එතැන දී දක්ෂිනාංශික අංශ වාමංශිකයින්ට වඩා අනාගතය නො දුටුවෝ ය.

මෙකී සංක්ෂිප්ත ඉතිහාසය දෙස බැලූ කල ලංකාවට නිදහස් අධ්‍යාපනය ලැබෙනුයේ සමාජයට අවශ්‍ය නිසා නො වන බැව් පසක් වේ. බටහිර දේශපාලන මතවල ගැටීමක් හේතුවෙන් නිරනුමානව ම සමාජය මතට බටහිර අධ්‍යාපනය කඩා වැටේ. එනම් ලාංකේය ශරීරවලට නො ගැළපෙන යමක් මනස තුළ විනිවිදීමට සැලසේ. මෙහි ඵලය ලෙස නිදහස් අධ්‍යාපනයේ දූ දරුවන්ගේ අපේක්ෂා පරිදි සමාජ හිතවාදීන් වනවා වෙනුවට අන්ත ප්‍රගතිගාමීහු බවට පත් වූහ. මෙකී දිළිඳු දූ දරුවන් අධ්‍යාපනය සලකන්නේ අනෙකා පරයා ඉහළට යාමට තැනූ ඉනිමගක් ලෙස ය. මොවුන්ගේ මවුපියන් ද සිටින්නේ එකී උන්නතිකාමී අදහසෙහි ය. තමා හෝ තමන්ගේ දරුවන්ට හැර අනෙකාට කුමක් වුව ද කම් නැතැ යි යන අදහසෙහි ඔවුන් එල්බ ගෙන ඇත. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර මහතාගේ නිදහස් අධ්‍යාපනයේ ධනේශ්වර ප්‍රතිඵල මෙයින් පැහැදිලි වේ. මොළය කේන්ද්‍රීය කරගත් යුරෝපීය අධ්‍යාපන ක්‍රමය ලංකාවට ආනයනය වීමෙන් ලාංකේය ජීවිතවලට සිදු වූයේ හීනමානය ඔඩුදුවාලීම යි. ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ අරමුණ, ලංකාවේ ධනේශ්වර ක්‍රමයට වඩාත් ම ගැළපෙන ඔළු පුහුණු කිරීමක් ලෙස මෙයින් හඳුනා ගත හැකි ය.

අධ්‍යාපන ක්‍රමය හා එහි සමාජ ප්‍රතිඵල නිදහසින් පසු දශකයේ සිට ම ලාංකේය තරුණයා කෙරෙහි වෙසෙසා බලපෑම් කෙරිණි. ඉංග්‍රීසීන් විසින් සීමිත අරමුණු කිහිපයක් සඳහා මෙහි ස්ථාපිත කරනු ලැබූ ඉංග්‍රීසි අධ්‍යාපනය 1956 න් මතු සිංහල මාධ්‍යයට හැරවුණි. එතැන් සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ මහා පරිහානියක් ඇරඹුණු බැව් විද්වත්හු පවසති. 1960

දශකයේ අග හා 1970 දශකයේ මුල අධ්‍යාපනයෙන් පිහිටක් නො ලැබ අතරමං වන තරුණ පිරිස් බොහෝ වෙති. සුභසාධන රාජ්‍යයේ සිංහල මාධ්‍යයෙන් කෙරෙන නිදහස් අධ්‍යාපනය 1977 න් පසු ඇති වූ නව ආර්ථික රටාව හමුවේ තව ද බොල් ප්‍රතිඵල ම ඇති කළේ ය. දේශපාලන මැදිහත්වීම මත පවත්නා අධ්‍යාපන ක්‍රමයෙන් හෙම්බත් ව ආර්ථික ක්‍රමයේ ගොදුරක් බවට පත් තරුණ පිරිස් බොහෝ වෙති. 1971 කැරැල්ලට සහභාගි වූ පිරිසෙන් විශාල ප්‍රමාණයක් අ.පො.ස. සාමාන්‍ය පෙළ තෙක් හෝ ඊට ඉහළට අධ්‍යාපනය ලැබූ අය වෙති. සාපේක්ෂ වශයෙන් වැඩි අධ්‍යාපනයක් ලබා ඇති ශිෂ්‍යයින් ද 1980 දශකයේ අරගලයට සම්බන්ධ වූ බවට ලකුණු ඇත. විශේෂයෙන් මෙයට හේතු වූ සමාජ ආර්ථික පසුබිම ද වැදගත් වේ. මෙයට හේතු වී ඇත්තේ විශේෂයෙන් පිටිසර පළාත්වල අඩු වශයෙන් ද්විතීයික පාසල් අධ්‍යාපනයක් හෝ ලද තරුණයින්ගේ අවශ්‍යතා හා අභිමතාර්ථ සපුරාලීමට අපොහොසත් වීම ය. සිය අභිමතාර්ථයන් ඉෂ්ටකර ගැනීමට නො හැකි වීම නිසාත්, ඵලදායී ස්වයං රැකියා මාර්ගවලට යොමුවීමට නො හැකි වීම නිසාත් සැලකිය යුතු ප්‍රමාණයක සාධාරණත්වයකින් යුක්ත ව අධ්‍යාපන ක්‍රමයට දොස් පවරන අධෛර්යමත් වූ හා බලාපොරොත්තු සුන් වූ තරුණ කොටස් වර්ධනය කරමින් ශිෂ්‍යයින් බැහැර කිරීමේ මේ ක්‍රියාවලිය වසරින් වසර දිගට ම පවතී.

අද්‍යතනයෙහි ලංකාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවලින් එකක් නම් අධ්‍යාපනය හා රැකියා නියුක්තිය අතර ඇති නො ගැළපීම යි. ප්‍රධාන වශයෙන් ම ද්විතීයික පාසල් හැර යන්නන් කෙරෙහි අවධානය නො දක්වීම යි. අනාගතයේ දී ඇතිවන බලාපොරොත්තු සුන්වීම් හා කැරලි වැළැක්වීමට අවශ්‍ය නම් මේ ප්‍රශ්න සම්බන්ධයෙන් එය හදිසි හා ප්‍රමුඛතාවක් ලැබිය යුතු කරුණක් ලෙස සලකා කටයුතු කළ යුතු ය. ජාතියේ කොඳු නාරටිය අධ්‍යාපන ක්‍රමය යි. කෙසේ වුව ද ලංකාවේ අධ්‍යාපන ක්‍රමය වසර ගණනක් පුරා විකාශනය වී ඇති ආකාරයට එහි යම් මූලික වරදක් ඇති බව හෙළිදරව් වෙයි. මිනිස් සමාජය තුළ සමානතාවක් ඇති කළ හැක්කේ මුළු දිවයින පුරා නො වෙනස් ප්‍රමිති හා ප්‍රතිමාණ පනවන මධ්‍යගත රාජ්‍ය නිලධාරිවාදයක් මගින් පමණක් ය යන්න දේශපාලන නායකයන් ස්ථිර ව විශ්වාස කිරීම බොහෝ දුරට මේ ගැටලුවේ ප්‍රභවය ලෙස දිස් වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා සේවා නියුක්තිය අතර බොහෝ විට නො ගැලපීමක් දිස් වේ. තමන් ලද අධ්‍යාපනයට සරිලන රැකියාවක් නො ලැබීම ද සම්මුඛ පරීක්ෂණවල දී ලද අධ්‍යාපනය අපේක්ෂිත රැකියාවට නො ගැලපීමෙන් තරුණයින් රැකියා වෙළෙඳ පොළෙන් විසි වී යාම ද, අධ්‍යාපනය ලැබීම සඳහා ඉඩකඩම් උගස් කොට එය බේරා ගැනීමට අසමත් ව ළතැවෙන තරුණ ප්‍රජාව ද බොහෝ වෙති. මොනිකා රුවන්පතිරණගේ 'සම්මුඛ පරීක්ෂණයේ දී ය' නම් පැදි පෙළ ද මෙහි ලා නිදසුන් වේ.

පොරණ රජුන් දවස සටන්
කිසිවක් මගෙ මතකයෙ නැත
මවෙත සිල්ප සදනු පිණිස
දෙගුරුන් කළ සටන මිසෙක
සුළඟ ජලය කඳු හෙල් වැටි
ගංගා හඳුනම් ද කෙලෙස
එසඳ අපට අහිමි ව ගිය බිම් අඟලෙහි
උරුමය මිස (රුවන්පතිරණ, 1974)

ධනවාදී සමාජ සැකැස්ම ප්‍රති නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ශ්‍රම නිපුණතා සහ පුහුණුව ලබාදෙන ගමන් ම ධනේශ්වර පන්ති ආධිපත්‍යය පිළිගැනීම හා එයට අවනතවීම පුහුණු කිරීම සිදුවන්නේ අල්තුසර් පෙන්වා දෙන ලෙස නිෂ්පාදන ක්ෂේත්‍රයෙන් පිටත ය. එය සිදුවන්නේ පාසල් සහ සෙසු අධ්‍යාපන ආයතන ද ඇතුළත් වන ධනේශ්වර අධ්‍යාපන ක්‍රමයෙහි ය. පාසල් දරුවෝ පාසල්වල දී ලිවීමට, කියැවීමට, ගණන් කිරීමට මෙන් ම වෙනත් හැකියාවන් ද ඉගෙන ගනිති. ඒ සමග ම පවත්නා ආධිපත්‍යධාරී ක්‍රමයට කීකරු වීමට ද එහි නීතිරීති අනුගමනය කිරීමට ද ඔවුහු පුහුණුව ලබති.

තමන් ලද අරුත් සුන් අධ්‍යාපනය කෙරෙහි තරුණයින් තුළ පැවතියේ ද්වේශසහගත සිතුවිල්ලකි. මන් ද යත්, එයින් මතු අනාගතයට තමන්ට එළක් ගත නො හැකි වූ බැවිනි. මෙකී අනුභූතිය නූතන කවීන් කෙරෙන් මතු වූයේ ද නිර්දය සිතුවිලි ලෙසිනි. තරුණයින් සිය ගුරුවරයා ඉගැන්වූ සිප් ධනය නැවත ලබාගෙන තමන් පිදූ ගුරු පඬුරු දෙන ලෙස පැවසීමෙන් එකී වෛරී මානසිකත්වය ප්‍රතීත වේ.

ඇදුරිඳුනි,
ඔබ දුන්න සිප් ධනය
ඔබ ම යළි අරගන්න
මා පිදූ ගුරු පඬුරු මට දෙන්න
(කොඩිතුවක්කු, 1972)

ධනේශ්වර ක්‍රමයෙහි ශ්‍රම ශක්තිය පුනර් නිෂ්පාදනය කිරීම සඳහා නිපුණතා ඉගෙන ගැනීම පමණක් ප්‍රමාණවත් නො වේ. කම්කරුවන් පවත්නා අධිපති ක්‍රමයට යටත් වීම ද පවත්නා පාලක මතවාදයට යටත් වීම ද එම දෘෂ්ටිවාදී භාවිතයන් අනුකරණය කිරීම ද පුනර් නිෂ්පාදනය කළ යුතු ය. පාසල, පල්ලිය, ජනමාධ්‍යය සහ අධ්‍යාපන ආයතනවලින් කෙරෙන කාර්යය එය යි. ශ්‍රම ශක්තියට අවශ්‍ය නිපුණතා පුනර් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය දැ සපයනු ලබන්නේ කම්කරුවන් කුඩා කලයේ සිට ම පුරුදු කරන මේ දෘෂ්ටිවාදීමය යටත් කර ගැනීම (ideological subjection) මාර්ගයෙනි. ධනවාදී රාජ්‍යය වැදගත් වන්නේ මෙතැන දී ය. අල්තුසර්ගේ තර්කය නම් පවත්නා පාලක මතවාදයට කම්කරුවන් හා පුරවැසියන් යටත් කර ගැනීමේ කාර්යය රාජ්‍යය සිය සුවිශේෂ ආයතන මගින් සිදුකරන විශේෂ කාර්යයක් ය යන්න යි. එහි දී අල්තුසර් මුහුණ දෙන න්‍යායික අභියෝගය නම් රාජ්‍යය පිළිබඳ සම්භාව්‍ය මාක්ස්වාදී න්‍යායෙහි මේ පිළිබඳ නිශ්චිත විග්‍රහයක්

නො තිබීම යි. එබැවින් එයට ඉඩකඩක් සපයමින් රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායට නව්‍ය කොටසක් එකතු කළ යුතු ය.

තරුණ තරුණියන්ගේ විවාහය කෙරෙහි ද පැවති අධ්‍යාපනය බලපෑවේ ය. තරුණවිය ඉක්මවා යන තෙක් අධ්‍යාපනය ලැබ එයින් නිසි රැකියාවක් නො ලැබ විවාහය වෙත තල්ලු වන තරුණියට දෑවැද්ද සඳහා දිය යුතු දෙයක් නො වේ. ඇත්තේ තමන් ලද සම්මාන සහතික පමණි. මෙවන් අනුභූතියක් ප්‍රස්තුත කරගත් නිර්මාණයක් ලෙස 'පමා වන මල්සරා' නම් කළ හැකි ය.

> දිනා ඇති සම්මාන සහතික ද එකතු කොට
> රටා පැදුරක් වියම් මගේ දෑතින් ඔහුට
> කවරදා හෝ දිනෙක මා සොයා එන ඔහුට
> එපමණකි ඇත්තෙ මට දෙන්න තිළිණයක් කොට (ගලප්පත්ති, 1983)

අල්තුසර්ගේ මතවාදයට අනුව දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය මර්දනකාරී රාජ්‍ය යාන්ත්‍රණයෙන් වෙන්කොට හඳුනාගත යුතු ය. එයින් එකක් ලෙස අධ්‍යාපන දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය හැඳින්විය හැකි ය. මර්දනකාරී රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රසිද්ධ, මහජන, පරිමණ්ඩලයේ පවතින්නකි. එහෙත් දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණ බොහොමයක් තිබෙන්නේ පුද්ගලික පරිමණ්ඩලයේ ය. එනම් ආගමික ස්ථානය, පක්ෂ, වෘත්තීය සමිති, පවුල, ඇතැම් පාසල්, බොහෝ පුවත්පත්, සංස්කෘතික ආයතන යන මේවා පුද්ගලික පරිමණ්ඩලයට අයත් ඒවා ලෙස අල්තුසර් හඳුන්වයි. අධ්‍යාපනයේ පවතින බොල් බව මෙකී අධ්‍යාපන දෘෂ්වාදී රාජ්‍ය යාන්ත්‍රණයේ ආධිපත්‍යය නිරූපිත පද්‍යයක් ලෙස උක්ත නිර්මාණය හැඳින්විය හැකි ය.

රෑ තුන්යම නිදිවරා ලද අධ්‍යාපනය අතරට පවුල් ප්‍රශ්න ගලා එනුයේ නිරායාසයෙනි. එවන් පීඩා හමුවේ තරුණයා ලබන අධ්‍යාපනය අර්ථ පූර්ණ වේ ද?

> අම්ම ඇවිත් එබිකම් කර හොරෙන් බලයි
> කහට ටිකක් බීපං පොඩි පුතේ කියයි
> අම්මත් සොම්නසින් නො නිදා පහන් කරයි
> මොහොතක් එතැන් සිට පාඩම අම්ම ගැන යි
> (කුඩාහෙට්ටි, 1975)

දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය ඇතැම්විට මර්දනයෙන් ද ක්‍රියාත්මක වන අතර එය පිරිසිඳු දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණයෙන් නොමැති ව සංකේතාත්මක ව ද ක්‍රියාත්මක විය හැකි ය. එමනිසා පල්ලි සහ පාසල් යන ආයතන සමාජය විනයගරුක කිරීමට, දඬුවම් දීමට, ඉවත්කිරීමට, තෝරාගැනීමට, පවුල නමැති සංකල්පය සංස්කෘතික කිරීමට මෙකී දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය ඉවහල් වේ.

පවත්නා අධ්‍යාපන ක්‍රමයේ උසස් ම ප්‍රදානයක් ලෙස උපාධි ලබා උපාධියට නො ගැලපෙන වෘත්තීන්හි යෙදෙන තරුණයෝ බොහෝ වෙති. එයින් එක් තරුණයකුගේ ජීවන අත්දැකීමක් රත්න ශ්‍රී විජේසිංහ 'සිරි කාලකන්නි' නමින් මෙසේ කවියට නගයි.

> අජානේය ඉස්කුටර් තුරඟු පිට
> නැඟී වාත වේගෙන් ඉගිලෙන කලට
> බඳා හිමි දෙවුර ඉස්සී බලන විට
> වැටේ ද යි කිරුළ සිතුණි ය බිසවුන්ට
> (විජේසිංහ, 1985)

කාව්‍යයෙහි රූපිත තරුණයා උපාධිය ලබා පැමිණ රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතේ කම්කරුවකු වී පාර කපයි. ඔහුගේ පැරණි පෙම්වතියක් යතුරු පැදියක් හිමි තරුණයකු සමඟ ඒ අසලින් යයි. ඇය උපාධිධාරී, කම්කරු පැරණි පෙම්වතා තඹයකට මායිම් නො කරන්නී ය.

දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණය හෙජමොනියෙහි බලපැවැත්මක් නොමැති ව කිසිදු පන්තියකට දිගුකලක් රාජ්‍ය බලය දරාගෙන සිටිය නො හැකි ය. මෙයට නිදසුන් ලෙස ලෙනින්ගේ සන්තාපයෙහි දක්වන්නේ අධ්‍යාපන දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණවල විප්ලවීයකරණය යි. මෙය සෝවියට් නිර්ධන පන්තියට ගෙන ඒමට ලෙනින් උත්සාහ දරයි. නිර්ධන පන්තියට රාජ්‍ය බලයක් නො වේ. ඔවුන්ට එම බලය අවශ්‍ය වන්නේ ඒකාධිපති පාලනයේ අනාගතය ආරක්ෂා කිරීමට සහ සමාජවාදයට මාරුවීම සඳහා ය. ධනවාදී සමාජ රටාව තුළ අධ්‍යාපනයට උරුම වූ ඉරණම උක්ත කවියෙන් කියාපායි.

අධික වෙහෙසක් දරා ලබන අධ්‍යාපනය කෙතරම් නිශ්ඵල ද යන්න විරෝධාකල්පයකින් යුතු ව රචිත පද්‍ය රැසක් අද්‍යතන කවීන් අතින් නිර්මාණය වේ. 'සොඳුර නුඹ මා ළඟ ම' නමැති නිර්මාණය මෙහි ලා දෙස් දෙයි.

> මල් පිපිලා බඹරුන්නේ නද විපු ල
> වල්කොළ කා ලද ශිල්පය මය අප ල
> කල්ගිය රෙදිවැරලි යට මැසිවිලි අපු ල
> හොල්මන් වෙවී වළඳමු ගුලියම චප ල
> (හෙට්ටිආරච්චි, 2019)

තවත් පසෙකින් සිව් වසරක් ගෙවා ලද ශාස්ත්‍රීය උපාධියෙහි පවත්නා නිහරවත් බව 'කසිකබල්' වෙලි පිටපත් ලිවීමේ රැකියාවක් වෙත තල්ලු වූ කථකයකුගේ අනුභූතියක් විෂය කරගත් පැදි පෙළක් ලෙස ළහිරු කිතලගමගේ 'විගසින් ඇවිත් එන්නම්, මතකය තාම එහෙම ම යි' නම් පැදි පෙළ දැක්විය හැකි ය.

> සල්ලි බාගය එපැයි' අද දවස මෙහි ඉන්න
> ඉනි වැට ම මං තමයි ගෙදර පැල රැකගන්න

උපාධිය අහවරයි ඒත් ජීවත් වෙන්න
දැන් 'මෙගා' ලියනවා එපා තරහා වෙන්න
(කිතලගම, 2017)

පවත්නා අධ්‍යාපන ක්‍රමය කෙතරම් අර්ථ පූර්ණ ද යන්න විවේචනාත්මක ස්වරයෙන් රචිත පැදි පෙළක් ලෙස සෞම්‍ය සඳරුවන් ලියනගේ විසින් රචිත 'මූසිල පරපුර' නම් කළ හැකි ය.

පෝස්ටර් අලවන්න
රැස්වීම් පුරවන්න
පොලිසියෙන් ගුටි කන්න
හොර ඡන්ද දාගන්න
පාරට ම ගෙවී ගිය
වෙහෙසකර ජීවිතේ
ගොම්මනේ තනිකඩ ව
ගාල්වෙයි කාමරේ (ලියනගේ, 2013)

ඉගෙන ගැනීමෙහි සෑම කෙනෙකුගේ ම මූලික අරමුණ අවසානයේ දී විභාගයක් සමත් වීම යි. පාසල්, විශ්වවිද්‍යාල, කළමනාකරණ ආයතන, තාක්ෂණික ආයතන ආදි කවරක හෝ වේවා ලංකාව වැනි රටක විභාගය සමත් වීම සඳහා පමණක් ම ශිෂ්‍යයින් ඉගෙන ගන්නේ ජීවත් වීමට වෙනත් මගක් නො වූයෙනි. පාසල් යන වයසේ සිටින දරුවන් සිටින බොහොමයක් මව්පියන්ගේ අපේක්ෂිතාර්ථය සිය දූදරුවන් වෛද්‍යවරයකු හෝ ඉංජිනේරුවෙකු හෝ කිරීම ය. පවුලකින් වෛද්‍යවරයෙකු, ඉංජිනේරුවකු බිහි නො වීම පිළිබඳ බොහෝ මව්පියෝ පසුතැවිලි වෙති. ලංකාව වැනි ඌන සංවර්ධිත රටක දී මෙසේ වනුයේ පහළ සමාජ පන්තිවලට සමාජ තත්ත්වයක් ලබා ගැනීමට තිබෙන එක ම ක්‍රමය වෛද්‍යවරයකු හෝ ඉංජිනේරුවකු කිරීම වන බැවිනි. නිදහස් අධ්‍යාපනයේ වර්තමානයේ මූලික ම කාර්යභාරය වී ඇත්තේ සමාජ තත්ත්වයක් නොමැති පවුල් සඳහා සමාජ තත්ත්වයක් ලබා දීම යි. මෙනයින් නිදහස් අධ්‍යාපනය නමැති ශානරයෙහි සංස්කෘතික ආධිපත්‍යයට හෙවත් හෙජමොනියට මෙරට වැසියා නිරනුමානව ම යොමු ව ඇත.

## 3.3 ප්‍රති හෙජමොනිය සහ ලිංගිකත්වය විෂය කරගත් සිංහල කාව්‍ය නිර්මාණ

### 3.3.1 ප්‍රති-හෙජමොනිය

හෙජමොනියේ තවදු සංකල්පයක් ලෙස ප්‍රති-හෙජමොනිය හැඳින්විය හැකි ය. හෙජමොනිය යනු පාලක පන්තියක් හෝ කණ්ඩායමක් දීර්ඝ කාලයක් පුරා සාපේක්ෂ ස්ථාවරත්වයකින් යුතු ව ක්‍රියාත්මක කරන සමාජ, දේශපාලන සහ ආර්ථික බලය යි. ප්‍රති-හෙජමොනිය (Counter-Hegemony) යනු අධිපතිවාදී පිළිවෙළකට ප්‍රතිවිරෝධය දක්වන සහ එය ප්‍රතිස්ථාපනය කිරීමට උත්සාහ කරන සමාජ ව්‍යාපාරවල සහ දේශපාලන බලවේගවල ප්‍රයත්නයන් වේ. ප්‍රති-හෙජමොනිය, හෙජමොනියේ අනුපූරකය යි. එනම් හෙජමොනිය හා ප්‍රති-හෙජමොනිය අතර අසමමිතික භාවය යි. මතුපිටින් එසේ වුව ද එය හෙජමොනියේ රැවටිලිකාර අනුපූරකයක් ලෙස හැඳින්විය හැකි ය. එවනාහි අවහෙජමොනික කිරීමකි. ප්‍රති-හෙජමොනිය වූ කලි ආධිපත්‍යයට විරුද්ධ ව ගොඩනැගුණු සංකල්පය යි. එනම් තත්කාලීන දේශපාලනයෙහි වූ නීත්‍යානුකූලභාවයට විරුද්ධ ව යෑම යි. එය විවිධ පැතිකඩවලින් විග්‍රහ කළ හැකි ය. ඉතිහාසය, සාහිත්‍යය, සංස්කෘතිය ආදි ස්තරවලින් එය විග්‍රහ කළ හැකි ය. ප්‍රති-හෙජමොනිය සරල ව හෙජමොනිය මත නො පිහිටයි. ප්‍රති-හෙජමොනිය විසින් හෙජමොනිය ප්‍රශ්න කිරීමට බඳුන් කරනු ලැබේ (Carroll, 2006). ප්‍රති-හෙජමොනිය, හෙජමොනියේ සංස්කෘතික සහ ආයතනික පදනම්වලට අභියෝග කරන සමාජ සහ දේශපාලන ක්‍රියාකාරීන්ගේ උත්සාහයන් වේ. ඔවුහු ආර්ථික, සමාජීය සහ දේශපාලන පිළිවෙළට යටින් පවතින ව්‍යූහ, විශ්වාස සහ සම්මත ප්‍රශ්න කරන අතර, පවතින තත්ත්වයට විකල්ප පවතින බවත්, අවශ්‍ය බවත්, සාක්ෂාත් කරගත හැකි බවත් පෙන්වීමට උත්සාහ දරති.

### 3.3.2 ලිංගිකත්වය සහ තාරුණ්‍යය

ශ්‍රී ලංකාවෙහි ලිංගික ජීවිතය යනු ගැහැනු පිරිමි දෙපක්ෂයේ ම තීරණාත්මක දේශපාලන මංසන්ධියක් වේ. නො එසේනම් සංස්කෘතියෙන් මැවූ සංසර්ග විශ්වය වෙනුවට ස්වභාවිකත්වය මත පදනම් වූ භාව යෝනි ජීවිතයට ඇතුළත් වීම ය. අපරදිග චින්තනයට අනුව මිනිසුන් දෙදෙනෙකුගේ එක්වීම ලිංගික ඉන්ද්‍රියන් එකිනෙක විනිවිදීමක් ලෙස සැලකේ. එසේ වුව ද පෙරදිග රටවල දෙදෙනෙකුගේ එක් වීම පිරික්සන ලද්දේ ලිංගික ඉන්ද්‍රියන්වලින් නො ව එය සමස්ත ජීවිත දෙකක් භාව ජීවිතය හා එක් වීමක් ලෙස ය.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවාංග ලෙස එක් වූ තුන් වැනි පරිච්ඡේදයෙහි වූ මූලික අයිතිවාසිකම් පිළිබඳ සඳහන වැදගත් වේ. මේ අනුව මිනිසකුට සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස, සාධාරණත්වයේ අයිතිවාසිකම, අත්තනෝමතික ව සිරබාරයට ගැනීමෙන්, දඬුවම් කිරීමෙන් ගැළවීමට ඇති අයිතිවාසිකම, භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ සහ යාම් ඊම් ආදියේ නිදහස පැහැදිලි ලෙස සංස්ථාපනය කොට ඇත. එසේ වුව ද මේ ව්‍යවස්ථාවේ ලිංගික නිදහස පිළිබඳ කිසිදු අදහසක් දක්වා නැත. මිනිසුන්ට ලිංගික ජීවිතයක් හෝ නිදහසක් නැත ය යනුවෙන් උපකල්පනය කොට මෙය ලියා ඇති බැව් දිස් වේ. එය හෙජමොනියට විරුද්ධ රැවටිලිකාර ප්‍රති-හෙජමොනික තත්ත්වයක් ගන්නේ එහෙයිනි. මුහුදු වෙරළෙහි, සිනමා හලෙහි, හෝටල් කාමරයෙහි පවතින ලිංගික සමාගමය දරුණු අපරාධයක් ලෙස තැකීම දරුණු මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් වන්නේ මේ නිසා ය. මෙකී ව්‍යවස්ථාවට අනුව ලංකාවෙහි පවතින්නේ

සමාජ ලිංගිකත්වයක් නො ව පවුල් ලිංගික සබඳතා පමණි. මේ හේතුවෙන් බසයේ සිදුවන ලිංගික අතරව, ස්ත්‍රීන් පැහැරගෙන යාම් හා ස්ත්‍රී දූෂණ, ඒ හා සම්බන්ධ නඩු, කුමර දූෂණ වැඩි වීමට හේතුකාරක වී ඇත්තේ මෙහෙයිනි.

1977 න් පසු ඇති වූ විවෘත ආර්ථිකයත් සමග තත් යුගයේ නිපන් සමාජ, සංස්කෘතික වටපිටාවට අනුව තරුණිය නොයෙක් ගැටලුවලට මුහුණ දෙන්නට විය. ආර්ථික වශයෙන් ජීවන වියදම ඉහළ යාම, සංකීර්ණ ප්‍රශ්නවලට මුහුණ දීම ආදි කටයුතු නිසා පිරිමියාගේ වැටුපෙන් පමණක් ජීවත් වීමේ හැකියාව ගිළිහී ගොස් තිබේ. මේ ආදි නොයෙක් ගැටලු හමුවේ රැකියාවල නියුතු කාන්තාවන්ගේ ගණන අනුක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමත් සමග නිදහස් වෙළෙඳ කලාප බිහි වීමෙන් පසු ව ඒ සඳහා ග්‍රාමීය තරුණියෝ වැඩි වශයෙන් යොමු වූහ.

1984 සංගණනයට අනුව කටුනායක සහ බියගම නිදහස් වෙළෙඳ කලාප ආශ්‍රිත රැකියාවල නියුතු සංඛ්‍යාවෙන් 90%ක් පමණ තරුණියෝ වෙති. මෙකී තරුණියෝ ඉතා සුළු වැටුපකට අවම පහසුකම් යටතේ වැඩ කරමින් ශ්‍රම සූරා කෑමට ලක් වෙති. නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට දීර්ඝ කාලයක් වෙහෙසීමට ඔවුන්ට සිදු වී ඇත. 1984 දී තරුණියන් සඳහා රාත්‍රී සේවය තහනම් කරන ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතියට අත්සන් තැබීම ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කළේ ය (ශ්‍රී ලංකාවේ කාන්තාවන්, 1995). එනමුදු රාත්‍රී සේවයේ යෙදීම නිසා තරුණියන්ගේ පුද්ගලික ආරක්ෂාවට තර්ජන එල්ල වන අතර, නිදහස් වෙළෙඳ කලාපයේ තරුණිය වෙත මේ තත්ත්වය ඍජු ව ම බලපායි. ඔවුන්ට නිසි නේවාසික පහසුකම් ද නොමැති අතර ඔවුහු සේවා ස්ථානවල දී හා මගතොට දී ලිංගික අතරවරවලට ලක් වූහ. එමතු ද නො ව රැකියා අරමුණු කොට ගමෙන් නගරයට සංක්‍රමණික තරුණියන්ගේ ආර්ථික පසුබිම සුබදායී නො වීමෙන් දිවා කාලයේ රැකියාවල නියුතු ව රාත්‍රී කාලයෙහි ගණිකා වෘත්තියෙහි යෙදීමට ද ඔවුහු යොමු වූහ. එසේ ම එයින් පැණ නැගුණු ප්‍රතිඵල ලෙස ගබ්සාව වෙත තරුණිය යොමු වූයේ නිරායාසයෙන් ම ය. පසෙකින් ගබ්සාවක් කර ගැනීමට පවා ආර්ථික ශක්තියක් නො වූ කල ඔවුහු විවාහය වෙත ම අවසානයේ තල්ලු වූහ.

1970න් පසු ඇති වූ සමාජ, ආර්ථික හා දේශපාලන ගතිකය නිසා තරුණිය අරබයා පැවති ආකල්ප හා වටිනාකම් වෙනස් විය. 1977 විවෘත ආර්ථිකයෙන් පසු එය තවත් දුර්දාන්ත මගකට පිවිසියේ ය. තරුණියන් අපයෝජනයට ලක්වීමේ ප්‍රවණතා මේ හා සමගාමී ව වර්ධනය විය. එසේ ම කාමභෝගී දිවි පෙවෙතේ ඒකදේශයක් ලෙස තරුණිය මුදලට විකිණීම කරණකොටගෙන ගණිකා මඩම් ද ශීඝ්‍ර ව්‍යාප්තියක් සිදු විය. රටෙහි පවත්නා නිතර වෙනස්වන කලිකහල හේතුකොටගෙන අවිනිශ්චිත ජීවන රටාවකට පිළිපන් ජනයා තාවකාලික සුඛාස්වාද තකා මෙවැනි දෑ කෙරෙහි නම්‍ය වූහ. මේ අයහ පුරුෂාර්ථ කෙරෙහි අද්‍යතන කවියාගේ දෑක්ම පෘථුල විය.

මොනිකා රුවන්පතිරණ 1975 කාන්තා වර්ෂය අරමුණු කොට රචිත *ඔබෙ යෙහෙළිය ඇය ගැහැනිය* නමැති ආඛ්‍යානරූපී කාව්‍යය වැය වන්නේ ද කාන්තාව වෙනුවෙනි. තරුණියක ලෙස ලොවට සැපත් ඇය අනාගතයේ මව් පදවියට උරුමක්කාරිය වන බැවින් ඇය සුරක්ෂිත කිරීමේ අගය කිවිඳිය පසක් කොට දෙයි.

සොලොස් විය පිරුණු උඹෙ නීල නෙත රුසිරු දැක
එදා මගෙ වත පුරා සිනා රැල්ලක් ඇඳිණි
සොඳුරු බව සොයන දන කිත් කිරුළු පළඳවන
උඹ මහත් අසිරිමත් රුවැතියක වූ බැවිනි
මනාලිය දිනෙහි උඹෙ නෙත් පහන් කැළුම් දැක
දියණියනි යළි මනෙත සිනහරැල්ලක් රැඳිනි
දූ පුතුන් ලබන්නට වාසනා වරම් ලද
ලෝසතන් පුද ලබන පතිනියක වූ බැවිනි
(රුවන්පතිරණ, 1975)

එක්තරා තරුණයෙකු මරදාන ප්‍රදේශයෙන් යන කල මහමග සිටි ගණිකාවක් යෝජනාවක් ගෙනෙයි. එම යෝජනාව ඔහු ප්‍රතික්ෂේප නො කරන්නේ මුදල් තිබෙන නිසා හෝ ඇයගේ පහස ලැබීමට රුචි වූ නිසා නො ව ඈ කෙරෙහි වූ සානුකම්පික සිතුවිල්ල නිසා ය. මහනුවර යුගයේ ජනකවියක ආභාසය ලබමින් රචිත මෙයින් ජන කවියෙහි වූ අව්‍යාජත්වය ද වැහෙයි.

අල්ලා ගෙන සරම අතකින් කිම් ද මලේ
වසා සාක්කුව අතකින් කිම් ද මලේ
දාහට අරන් සීයට දී කිම් ද මලේ
කාමරයක නැවතී අපි යමු ද මලේ
(කුඩාහෙට්ටි, 1972)

නිදහස් වෙළෙඳ කලාපයෙහි ශ්‍රමික තරුණියන්ට මනා සමාජ ගරුත්වයක් නො ලැබේ. එමතු ද නොව ශ්‍රම සූරාකෑම ද ප්‍රබල ය. ලංකාවේ අපනයන ආදායමෙන් බොහෝ ප්‍රමාණයක් උපයන ඇඟලුම් සේවිකාවන්ගේ ජීවන තතු හෝ සමාජ තතු ද එතරම් යහපත් නො වේ. ප්‍රමාණවත් නො වන වැටුප් ද, සෞඛ්‍ය පහසුකම්වලින් තොර වාසස්ථාන ද, ශක්තිය ඉක්මවා කිරීමට බල කෙරෙන වැඩ ද මගින් පීඩනයට පත්වන මෙකී ශ්‍රමිකයන් බාහිර සමාජයේ දී ද පීඩනයට නතු වන අයුරු රත්න ශ්‍රී විජේසිංහගේ 'පැණි කෑ ගැහැනිය' නම් නිර්මාණයෙන් පුද්ගල නිරීක්ෂණයට නතු ව ඇත.

ලයිට් කපන ගනදුර එන නගරයට
නොයෙක් භෘංගයෝ රිංගති පෝලිමට
ඇවිත් රෑ වැඩට පේ වෙන රන් කඳට
සාදු සාදු ඇස් ලැබියන් කළුවරට
(විජේසිංහ, 1985)

දිවා රාත්‍රී දෙකෙහි ද්විත්ව රැකියාවක නියුතු කතුන් දෙස ද නූතන කවියා විමසිලිමත් විය. දිවා කල කම්හල්වලට සිය ශ්‍රමය දියකර හරින ස්ත්‍රීහු රාත්‍රියේ කන්‍යා සල්පිල්වල සිය ඇඟ මස දන්දෙති. රැකියා අරමුණු කොටගෙන ගමෙන් නගරයට සංක්‍රමණය වූ තරුණියන්ගේ මේ ඛේදාන්තය වස්තු කොට ගත්තකි 'කන්‍යා සල්පිල'.

ඔච්චමක් නොවෙයි මහතුනි අසනු මැනා
පිච්ච මල් වඩම් ගෙල මළ පුඬුව උනා
පුෂ්පරාග මිණි සේ ගම උන්නු ළමා
සත්තකින් සෙළුව වෙන්දේසියේ දමා
(හෙට්ටිආරච්චි, 1989)

ගම්බද තරුණියන් ද ලිංගික ගොදුරක් බවට පත් වූ අවස්ථා අද්‍යතන කවීන් කෙරෙන් නිරූපණය වෙයි. ටිම්රාන් කීර්තිගේ 'මැජික් ඇස් හය' නමැති නිර්මාණය මෙහි ලා දැක්විය හැකි ය.

තාත්තා වැඩ පෙන්නද්දි පොළ ළඟ
මැජික් හාවෙක් ඇවිත් ගෙදරට
කැරට් අලයක් කවල නංගිට
සරුවත්තෙකක් බීලා තිබහට
ආපහු දිව්වාලු කැළයට
නිදි නො ලැබ ඇඬුවට
වරදත් වැටුණෙ නංගිට
පවුලෙ දැලි ගෑව සෝකෙට
කැළෑ මල පාවුණා ඈතට (කීර්ති, 2020)

ලිංගික කාරණාව සහ ආර්ථිකය එකිනෙක සමවාය ලෙස බැඳී පවතී. නිශ්චිත ආර්ථික සුරක්ෂිත බවකින් තොර ව විවාහයක් පිළිබඳ ව ද සිතීම උගහට ය. මෙහෙයින් අකාලයේ දිය වී යන තාරුණ්‍යය අභිමුව හැඟීම් ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න පිරිමි ඇසකින් සියුම් ලෙස විග්‍රහ කළ කවක් ලෙස මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ 'ඇහි පියන් ඇහිරිලා' නමැති පද්‍යය දැක්විය හැකි ය.

පස් මහා බැලුම් ලා
ඇස් පියල්ලක පහස සොයමි
ඉස්තරම් මඟුල් කා
හස්තයෙන් මධුසමය විඳිමි (මස්ඉඹුල, 2011)

ෆෝඩ්වාදය පිළිබඳ ග්‍රාම්ස්චියානු විශ්ලේෂණයේ ඇති වැදගත් පැතිමානයක් නම් ඔහු ධනවාදයේ නව අදියරට උචිත වන නව සමාජ ලිංගික, සදාචාරමය හා ආගමික පර්යායක් ගොඩ නැගීමේ ප්‍රයත්නය ද සැලකිල්ලට ගැනීම යි. එය ආර්ථිකමය ප්‍රතිසංස්කරණයක් හා ඓන්ද්‍රීය ව බැඳුණු බුද්ධිමය සදාචාරමය සහ ලිංගිකමය ප්‍රතිසංස්කරණයක් යන අරුතින් ග්‍රාම්ස්චියානු ඓතිහාසික හවුල පිළිබඳ මනා නිදසුනකි. ග්‍රාම්ස්චි ෆෝඩ්වාදය තුළ හෙජමොනිය ප්‍රභවය ලබන්නේ කර්මාන්ත ශාලාවෙහි දී බැව් පවසයි (Gramsci, 1971). එසේ ම ග්‍රාම්ස්චිගේ හෙජමොනිය ආර්ථිකමය සබඳතාවලින් වියුක්ත කොට හුදෙක් සංස්කෘතිකමය හා දෘෂ්ටිවාදීමය වූවක් ලෙස තේරුම් කරන න්‍යායික ප්‍රවණතාවලට මනා ප්‍රතිචාරයක් ඔහුගේ ලිවීම් ඇසුරින් මතු කරගත හැකි ය.

අද්‍යතන දේශපාලන කරළියෙහි සිදුවන ලිංගික සූරාකෑම් පිළිබඳව ද කවියාගේ නිරීක්ෂණ පථය යොමු වූ තැනක් ලෙස වත්මන් දේශපාලනඥයකු විසින් කාන්තාවන් සියයක් අපචාරයට ලක් කිරීම උත්සවාකාරයෙන් සැමරූ අවස්ථාවක් දැක්වෙන කවක් ලෙස 'මැණික් ගඟටත් ඉවුරෙ චූ යයි' නමැති පද්‍යය සැලකිය හැකි ය.

පියයුරු දෙසීයයි
දෙකෙන් බෙදුවම ගෑනු සීයයි
සාදය නන්දනීයයි
මැණික් ගඟටත් ඉවුරෙ චූ යයි
(බන්දුජීව, 2013)

මේ ක්‍රියාදාමය වර්තමානයේ කැරෝකේ ක්ලබ් දක්වා ප්‍රසාරණය වී ඇති ආකාරය දක්නට හැකි ය. එවන් තත්ත්වයකට තරුණිය පත්වීම විෂයෙහි බලපවත්වන දෘෂ්ටිවාදී කාරණා සාකච්ඡා කරන පැදි පෙළක් ලෙස සෞම්‍ය සඳරුවන් ලියනගේ රචනා කළ 'හැටේ වත්තේ මග්දලේනා' නමැති නිර්මාණය දැක්විය හැකි ය.

කැරෝකේ ක්ලබ් එකේ
පින්සාර සුන්දරී
යාන්තං විසිතුනක් වයසැතී,
හැමදාම පාන්දර පමා වී
වැඩ ඇරී ගේ බලා දුවන්නී
ඇගේ නාමය මග්දලේනා ය
හැමදා ම හදවතින් පල්ලි යන
ඉරිදාට වේලපහ වැඩට යන
(ලියනගේ, 2014)

මෙවැනි ම අනුභූයක් රැගත් ස්පා කුමරියක පිළිබඳ රචිත සම්පත් කුරුප්පුආරච්චිගේ 'HIV මාරාන්තිකයි' නමැති චිරන්තන සම්ප්‍රදායට නැඹුරු වූ නිර්මාණය දැක්විය හැකි ය.

සුවඳ සඳුන් කොකු මගරිඳු ඇඟ ඉහිරී
සර්ප පැටව් හැව හැරවාගති වැතිරී
රිදෙන තැන් බලා තෙල් ගල්වන සොඳුරී
කාලිදාස මත්කළ ස්පා කුමරී
(කුරුප්පුආරච්චි, 2021)

ස්ත්‍රී සිරුර පිළිබඳ සංකල්පය ගොනු කොට ඇත්තේ පිරිමින් මිස ගැහැනුන් නො වේ. ස්ත්‍රී දූෂණය යන ක්‍රියාව ම මෙබැව් මැනවින් පැහැදිලි කෙරෙයි. කැමැත්ත-අකමැත්ත, දූෂණය-යහපත, ලිංගික-අලිංගික, නෛතික-සිවිල්, නඩුව-මිනිස් ක්‍රියාකාරිත්වය යන මේ සියලු ම සහසබඳතා ප්‍රතිපක්ෂ වෙනස්කම් තීරණය කරන්නේ පිරිමින්

නිසා ස්ත්‍රී දූෂණය යනු පිරිමින්ගේ ම සංකල්පයකි. එවනාහි ප්‍රති-හෙජමොනික තත්ත්වයක් ගනියි.

## 3.4 ජනප්‍රිය සංස්කෘතිය සහ තාරුණ්‍යය විෂය කරගත් සිංහල කාව්‍ය නිර්මාණ

### 3.4.1 ජනප්‍රිය සංස්කෘතිය

ජනප්‍රිය සංස්කෘතිය වර්තමාන කලා විචාරකයන්ගේ සියුම් විමර්ශනයට හා වාද විවාදවලට මුල් වී ඇති සංකල්පයකි. සංස්කෘතික අධ්‍යයනය, මානව විද්‍යාව බඳු නවීන ශික්ෂණ මාර්ගවලට අඩිතාලම වී ඇත්තේ ජනප්‍රිය සංස්කෘතිය හා එහි ගැබ් ව ඇති විවිධ මානව අර්ථ යි. ජනප්‍රිය සංස්කෘතිය අරබයා අර්ථකථන ඉදිරිපත් කිරීමට උත්සුක වන ප්‍රාඥයන් හා සංස්කෘතික විශ්ලේෂකයන් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. එයින් පළමු ගණයට අයත් වන්නෝ ජනප්‍රිය සංස්කෘතිය යන්න නිසරු පදාර්ථයක් ලෙස බැහැර කරති. නො ගැඹුරු වින්දනය, සුලබ චින්තනය, වාණිජත්වය, රසිකයන් අද්භූත ලෝකවලට ප්‍රවිෂ්ට කරවීම ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදනවලට ආවේණික වූ ලක්ෂණ ලෙස ඔවුහු දකිති. දෙවැනි ගණයට අයත් වන කලාවේදීහු ජනප්‍රිය සංස්කෘතිය අර්ථවත් චින්තන පථයක් ලෙස හුවාදක්වති. දෛනික ජීවිතය හා සංස්කෘතිය අතර සම්බන්ධය, දෘෂ්ටිවාදයෙහි බලපෑම, පොදුජනයාගේ අභිව්‍යක්තිය ආදිය මතු කොට දැක්වීමට අනුබල දෙන ක්ෂේත්‍රයක් ලෙස ඔවුහු ජනප්‍රිය සංස්කෘතිය අගය කරති.

බටහිර විචාරකයන් ජනප්‍රිය සංස්කෘතිය නමැති සංකල්පය විවරණය කරන ආකාරයට ප්‍රධාන වශයෙන් ප්‍රවේශ කිහිපයකට බෙදා දැක්විය හැකි ය (දිසානායක, 2004.) ජනප්‍රිය සංස්කෘතිය හා සම්බන්ධ එක් ප්‍රවේශයක් අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ ලිපි ලේඛනවලින් ආභාසය ලද්දකි. ග්‍රාම්ස්චි විසින් නවීන බුද්ධිමතුන් අතර ව්‍යාප්ත කරන ලද සංකල්පයකි, හෙජමොනිය. හෙජමොනිය යන්න සමාජ කණ්ඩායම්, සමාජීය ඒකාධිකාරය යටතේ සිටින කණ්ඩායම්වලට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් පාලනය කිරීමත්, නො එසේනම් පාලිතයන්ගේ කැමැත්ත දිනාගෙන හැඩගස්වා ඉහළ-පහළ පන්තිවල නීත්‍යානුකූල ව පාලනය ගෙනයෑම අදහස් කෙරෙයි (Hebdige, 1979).

මෙය ජන සමාජයෙහි බලය ඇත්තන් සෙස්සන්ගේ අවනතිය හා සම්මතිය ලබා ගන්නා ආකාරය විශද කරන්නකි. මේ සංකල්පයත් ජනප්‍රිය සංස්කෘතියත් අතර සබඳතාවක් ඇත. සමාජ අත්දැකීම් පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් කිරීමටත් බලය ඇත්තන්ගේ ඇතැම් ක්‍රියාමාර්ගවලට ප්‍රතිවිරෝධය දැක්වීමටත් උචිත භූමිභාගයක් ලෙස ජනප්‍රිය සංස්කෘතිය පොදු ජනයා උපයෝගී කරගන්නා අයුරු පෙන්නුම් කිරීම මෙමගින් සිදුකෙරේ (Gramsci, 1970).

### 3.4.2 ජනප්‍රිය සංස්කෘතිය සහ තාරුණ්‍යය

ජනප්‍රිය සංස්කෘතියේ විවිධ දිශානති ලාංකේය තාරුණ්‍යය කෙරෙන් විද්‍යමාන වන අතර එද අද්‍යතන කවීන්ට නො මඳ වස්තූන් සැපයී ය. අභිනවයෙන් නිපන් සමාජ දේහයේ දියුණු යැයි සම්මත බටහිරදිග ජාතීන් විසින් තම සුබවිහරණ දිවියෙහි කරනු ලබන සාටෝපවත් ක්‍රියා මෙරටෙහි ද මුල් බැසගැනීම කෙරෙහි නූතන කවියා හෙළුවේ සදය උපහාසාත්මක බැල්මකි. ගෝලීයකරණයත් සමග ගොඩ නැගුණු විශ්වගම්මාන සංකල්පයෙහි තරුණ සිතුම්පැතුම් වෙනස් විය. අන්තර්ජාලය හරහා විශ්ව පවුලක් බවට පත් වූ සමාජය අද්‍යතනයෙහි විශ්ව පුද්ගලයා දක්වා සංකෝචනය වෙමින් පවතී. මෙවන් පසුබිමක තරුණයා පරිගණකය හා අන්තර්ජාලය වටා රොදබැඳ ඇත. මෙහි දී සිදු ව ඇති තරුණයාගේ විපරිණාමය ද නූතන කවියාගේ දෘෂ්ටි පථය විවෘත කළේ ය. පරාක්‍රම කොඩිතුවක්කුගේ 'විදුලි පුවත්' නමැති පද්‍යය මෙහි ලා දෙස් දෙයි.

> අන්තර්ජාලවල කිමිදෙයි
> ගිලුණු නැවක පෙම් සැකිලි සොයයි
> ලොවෙහි ලොකු ම පැණි කැවුම තැනෙයි
> රූ දසුනෙන් කිරි සයුරු ගලයි
> බිලිඳු හදක පණ නල වියැලෙයි
> (කොඩිතුවක්කු, 2004)

බර්ට් බී. කුඩාහෙට්ටිගේ 'භූගෝලීය ප්‍රාග්ධනය හා පුංචි මිනිස්සු' නම් නිර්මාණය ද මෙබඳු ම වස්තු විෂයක් රැගත් කවකි. මෙවන් ගෝලීය පරිසරයක කිසිදු යුග පුරුෂයකු බිහි නො වන බැව් කවියා හඟියි. මෙහෙයින් සමස්ත පරපුර ම වඳ වී ඇති සෙයක් ඔහු දකියි.

> එකදු මහ පුරුෂයකු
> සොයාගන්නට බැරි ය
> බේතකට
> අවාරේ වඳවෙලා පරපුර ම
> යටවෙලා ගෝලීය
> ප්‍රාග්ධනයට (කුඩාහෙට්ටි, 2010)

සමකාලීන යුගයේ ධනවාදී සංවර්ධනය විසින් සමස්ත මිනිස් වර්ගයාත් ජෛව ගෝලයත් ආපසු හැරවිය නො හැකි විනාශයක් කරා රැගෙන යමින් තිබෙන්නේ ය යන අදහස විවිධ ප්‍රගතිශීලී බුද්ධිමය කවෙන් දන් මතු ව එන්නට පටන්ගෙන තිබේ. ස්ලේවෝයි ශිෂෙක්ට අනුව අප දැන් ජීවත් වන්නේ 'සමාප්ත කාලයක ය' (Zizek, 1960). ධනවාදී සංවර්ධනය විසින් මිනිස් වර්ගයා රැගෙන යමින් තිබෙන විනාශකාරී දිශානතිය ඉදිරි දශක කිහිපය තුළ දී ආපස්සට හැරවීමට අප අසමත් වුවහොත් සමස්ත ගෝලීය පරිසර පද්ධතියත් සමග අප සාමූහික ව්‍යසනයකට ගොදුරු වීමට නියමිත ය යන්න එහි අදහස යි.

අඩු අධ්‍යාපන ලාභී පහළ රැකියාවල නියුතු තරුණයා ද විවෘත ආර්ථිකයෙහි දැඩි ගොදුරක් ව ඇත. තරුණ රියදුරන් ද ඒ අතර වෙසෙස් වේ. බස්රථවල අධික ශබ්දයෙන් හැඬවෙන විරහ ගී, බසය වසා සිටින දේව රූප ආදිය ඔවුන්ගේ පන්තිය හා ආකල්ප හෙළි කරයි. රත්න ශ්‍රී විජේසිංහගේ 'තරුණ රියදුරාගේ අලුයම් තේවාව' නමින් යුතු පැදි පෙළ ද මෙයට සනිදර්ශනයකි.

කණ්ණඩි කැටපත දූලි
හඳුන් කිරි පැනින් දොවමි
හඳුන්කූරු දල්වා
මල් මාලා වට සදමි
බස් රිය මල් යානක් කරමි
පා පැටලේවි
පරිස්සමින් අල්ලාගෙන නගින්න දේවි
(විජේසිංහ, 1996)

ක්‍රිකට් ක්‍රීඩාව මෙරටෙහි තරුණයින්ගේ සිතුවිලි පථය පුළුල් කළ ක්ෂේත්‍රයකි. එහි ගොදුරක් බවට පත් තරුණ තරුණියෝ ද වෙති. බහුභාණ්ඩික සමාජ ක්‍රමයක් කරා ගෙනයන බටහිර රටවලින් විසිවන විලාසිතා මෙරටෙහි තරුණ තරුණියන් අන්ධානුකරණයෙන් වැළඳ ගැනීමත් එමගින් සිදුවූ සංස්කෘතික හායනයත් නූතන කවියාගේ දෘෂ්ටි පථය පුළුල් කළේ ය. එහි ගොදුරක් වූ තරුණියන්ගේ ඇවතුම් පැවතුම් දෙස ඔවුන් බැලුවේ උපහාසාත්මක බැල්මකි. ක්‍රිකට් ක්‍රීඩාව අතරතුර වෙළෙඳ දැන්වීම් ප්‍රචාරකයින්ගේ ගොදුරක් වූ රංගනයක යෙදෙන තරුණියන් විෂය කරගත් නිර්මාණයකි, 'මගේ චියරින් කෙල්ලෙ පුරාහඳටත් පිස්සු' නමැති නිර්මාණය.

රුවන්තිකා
ඔයා එදා මාරයිනේ
චියර් ඩාන්සිං කෙල්ල
අම්මට සිරි
කොටට ඇඳල කිටි කිටියට
උපන් ලපේටත් ලැජ්ජැති
දැතින් සවරං වන සිලි සිලියේ
මාර ඩාන්සිං පාරක්
ෆිට් එකට ම කළු කිට් එක
ලෙදර් සපත්තුත් දිස්නෙට
(හෙට්ටිආරච්චි, 2012)

උපන් ලපේටත් ලැජ්ජැති, සවරං වන වන, ෆිට් එකට ම කළු කිට් එක, ලෙදර් සපත්තු ඈ යෙදුම් තත් උපහාසය වඩවයි. මෙරට වැඩි කලක් යටත් විජිතයක් ලෙස පැවති මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිත ජානමය වශයෙන් මිශ්‍ර ජාතීන් බිහි වන්නට විය. එසේ උපන් පිරිස් එරටට ද මෙරටට ද නැති ගන්ධබ්බ දිවියකට පිළිපන්හ. ඔවුන්ගේ දූපුතුන්ට විවෘත ආර්ථික රටාව තෝතැන්නක් විය. බම්බලපිටිය, ගල්කිස්ස, වත්තල, කඳාන ආශ්‍රිත මුහුදු තීරයෙහි මෙකී ප්‍රවණතාව වඩවඩාත් දක්නට ලැබේ. කැරෝකේ ක්ලබ් දක්වා ප්‍රසාරණය වී ඇති තත් පුරුෂාර්ථ හමුවෙහි තරුණිය ද ලිංගික මෙවලමක් ව ඇත. මෙකී යථාර්ථය පසක් කරන පද්‍යයකි, මතු දැක්වෙනුයේ.

ගිය සතියේ
මං නැටුවානේ
කැබරේ
බම්බලපිටියෙ
ක්ලබ් එකේ
සූ ගාලා
කස්ටමස්ල
ටිප් එක
කැපුණා ගාණට
(හෙට්ටිආරච්චි, 2013)

රූපවාහිනී අදහස්, දර්ශනය වැනි දෑ පාරිභෝගික භාණ්ඩ බවට පත් වේ. ඒ මත මරණය ද පාරිභෝගික භාණ්ඩයක් බවට පත් වේ. ලාංකේය සංස්කෘතික හෙජමොනිය දෘෂ්ටිවාදී ආධිපත්‍යයක් බවට පත්වන අයුරු මෙයින් ද හඳුනාගත හැකි ය. ජීවිතය මරණය හා පවතින සහසබඳතාව ප්‍රතිපක්ෂයේ ජීවිතය නමැති පසෙහි කාර්මික සමාජයේ අවසානයත් සමග සම්පූර්ණයෙන් ම පාරිභෝගිකකරණය වී අවසාන ය. ප්‍රතිපක්ෂයේ අනෙක් පස වන මරණය පාරිභෝගීකරණය වීම පශ්චාත් කාර්මික සමාජය සමග ආරම්භ වේ. රක්ෂණයේ මිල අධිකතම පාරිභෝගික භාණ්ඩය මරණය යි. මරණය දක්වා ක්‍රමක්‍රමයෙන් ජීවිතය අඩුවෙමින් පවතින අවදානම් අවරෝහණ පිළිවෙළකට රක්ෂණය වාරික මිල ගැන්වේ. මරණයට මෙහා පවතින හදිසි අනතුරු සඳහා විවිධ මිල ගණන් තීරණය වේ. මෙතෙක් විකිණූ ජීවිතය වෙනුවට මරණය ද විකිණීමට අවකාශ සැලසේ. මේ පිළිබඳ පවුලෙහි වැසියන් සතුටු වන බැවින් රක්ෂණකරුවෝ ඔවුන් සොයා හඹා එති. මෙකී චක්‍රීය ක්‍රියාදාමයෙන් මෙරට ජනප්‍රිය සංස්කෘතියේ ඒකදේශයක් විවෘත වේ. එවනාහි ඇන්ටි-හෙජමොනික් වීමකි.

1980 දශකයේ මුල් කාලයේ ම රූපවාහිනිය හඳුන්වා දීම නිසා බහුතර ජනතාවට බාහිර ලෝකයට පිවිසීමට විශාල කවුළුවක් විවර විය. ලෝකයේ නොයෙක් ප්‍රදේශවලින් තොරතුරු හා සමාජ ප්‍රතිරූප ගලා එන්නට විය. සංචාරකයින් විශාල වශයෙන් ලංකාවට පැමිණීම හා රැකියා සඳහා සහ සංචාර සඳහා ලාංකිකයන් විදේශයන්හි ගත කර ලංකාවට පැමිණීම වැඩිවීම ද පාරිභෝජන ප්‍රවණතා තීව්‍ර කිරීමට හේතු විය. කර්මාන්තශාලා සේවකයෝ පවා ක්‍රමයෙන් ස්වකීය ස්වාමිවරුන්ගේ ජීවන රටා සංකේතාත්මක ව අනුකරණය කිරීමට හුරු වූහ. නවීන ඇඳුම් පැළඳුම් භාවිතය, සංගීත සංදර්ශන සඳහා සහභාගි වීම, කැසට් රෙකෝඩර්, රූපවාහිනී විද්‍යුත් ගෘහ උපකරණ ආදිය ඒකරාශී කිරීම කර්මාන්තශාලා සේවක සේවිකාවන්ගේ ජීවන රටාව බවට පත් ව තිබේ. 1990 න් පමණ මතු නව රූපවාහිනී නාලිකා සහ ගුවන් විදුලි සේවා රාශියක් බිහි වූ අතර අනතුරුව පරිගණකය හා සමාජ මාධ්‍ය

ජාලා පැමිණීමෙන් පසු ඒවා ජන විඥ්ඥාණය හසුරුවන සාධක බවට පත්වෙමින් පවතී.

රියැලිටි ෆැන්ටසිවල දිවි ගෙවන තුරුණු ජීවිත සදය උපහාසාත්මක ලෙස කළ තවදු පබැඳුමක් ලෙස 'සිත සහ කය' නමැති නිර්මාණය අගය කළ හැකි ය. නිර්ධන තරුණියන් මවාගත් කල්පිත ලොව පිළිබඳ වාග් චිත්‍රයක් මෙයින් මවාගත හැකි ය.

නිසංසලා
කය තිබුනේ පැලහි පැලහි
ලැලි කඩේ සමලංකෘත ගැස් දුමක
තාරා දෙවඟන රූපෙක හෙවණැල්ලක
සිත තිබුනේ තෙරපි තෙරපි
මෘදංග ගැටබෙර නර්තන රියැලිටියක
ඔල්වරසන් වරුසාවක බැල්කනියක
(හෙට්ටිආරච්චි, 2013)

දස අතේ ණය තුරුස් වී විවාහ මංගලෝත්සව ජයට ගැනීමට තරුණ පරපුර ගතකරන ප්‍රෝත්සාහය සදය උපහාසයට ලක් කළ නිර්මාණයක් ලෙස මහින්ද ප්‍රසාද් මස්ඉඹුල කවියාගේ 'මනාලිය' නම් කළ හැකි ය.

නළල අතරේ දුවයි ඇහි බැම
රූපලාවන්නියක ඇද කළ
මල් බොකේ ගැටගැසූ කම්බිය
තිබේ මහපටැඟිල්ල හිල් කර
පෙර දිනෙහි දහවලෙහි දුටු පසු
නොදුටු අහරක් ඇගේ කුස ගැන
යුවතිපති වත් දැන සිටියෙ නැත
ලැබුණු වෙල්කම්ඩ්‍රින්ක් එක මිස
(මස්ඉඹුල, 2010)

මෙවැනි ම අනුභූතියක් විෂය කරගත් නිර්මාණයක් ලෙස සෞම්‍ය සඳරුවන් ලියනගේ විසින් විරචිත 'ඉතිං අපි බඳිනවා' නමැති පද්‍යය දැක්විය හැකි ය.

කේක් එක රෙජිෆෝම්, ටජ්මහල සුන්දර ය
කාරෙකට පහළොවයි බෙන්ස් ඊටත් වැඩි ය
සුජාතා නංගිගෙනි මල් කළඹ දොළහකට
සාරියට තිස් පහයි, වර්ක් එක නම් වෙනම
(ලියනගේ, 2014)

ජනප්‍රිය සංස්කෘතිය බිහි වූයේ කාර්මිකත්වයෙහිත් නාගරිකත්වයෙහිත් ප්‍රතිඵල වශයෙනි. (Hettige, 1998) නවීන තාක්ෂණයෙහි හා ජනමාධ්‍යවල ප්‍රසාරණයත් සමඟ ජනප්‍රිය සංස්කෘතිය ප්‍රබල සත්තාවක් බවට පත් විය. ජනමාධ්‍යවල ව්‍යාප්තියට පෙර ලෝකයේ සෑම සමාජයක ම පාහේ ගැමි සංස්කෘතියක් පැවතිණ. එහෙත් ගුවන්විදුලිය, චිත්‍රපටය, රූපවාහිනිය, අන්තර්ජාලය වැනි ජනසන්නිවේදන මාධ්‍ය වඩවඩා සමාජය කෙරෙහි බලපෑමට පටන් ගැනීමත් සමඟ ගැමි සංස්කෘතිය අභිභවා ජනප්‍රිය සංස්කෘතිය මතු විය. එවනාහි ඇන්ටි-හෙජමොනික් වීමකි.

## 4. නිගමන සහ නිර්දේශ

මෙකී පර්යේෂණයෙන් අනාවරිත වන්නේ සමකාලීන යුගයේ නිරූපිත තරුණ ප්‍රශ්න වනාහි මතුපිටින් පෙනෙන ඒවාට වඩා දෘෂ්ටිවාදී තලයක පිහිටන බව ය. එවනාහි හෙජමොනිය නමැති යාන්ත්‍රණයෙහි ඒකදේශයක් වන දෘෂ්වාදී හෙජමොනිය යි. එනම් හෙජමොනිය, සංස්කෘතික හෙජමොනිය, ප්‍රති-හෙජමොනිය යන සියලු ධාරාවන් රූපණය වන්නේ දෘෂ්ටිවාදී තලයක ය. මේ අනුව අපට නිගමනය කළ හැක්කේ ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය සඳහා බලපා ඇත්තේ දෘෂ්ටිවාදී රාජ්‍ය යාන්ත්‍රණයේ බලපෑම වන බව යි. (Ideological State Apparatus)

නූතන සිංහල කාව්‍ය නිර්මාණවල නිරූපිත තාරුණ්‍යය සඳහා බලාපෑ සමාජ, ආර්ථික සහ දේශපාලන සාධක කවියෙහි නිරූපණය වන්නේ ආධ්‍යාත්මික ආකාරයෙනි. තත් සාධකවල පසු කම්පන ලෙස මානසික පීඩනය, විඩාබරබව, කනගාටුව, එරෙහි ව නැඟී සිටීම ආදිය පිළිබිඹු වන එක් අන්තයක සිට කරුණාව, සෙනෙහස, මෛත්‍රිය මෙන් ම සියල්ල දරා ගැනීම හා එයිනුත් ඔබ්බෙහි උපේක්ෂාව ස්පර්ශ කරන ස්ත්‍රී පුරුෂ පුද්ගල චින්තනය මේ ආධ්‍යාත්මිකත්වය නියෝජනය කරයි. මේ ස්වරූපය, තත් යුගයේ තරුණ ප්‍රශ්න ඉලක්ක කරගත් අනෙකුත් පර්යේෂණ අනාවරණ හා සංඛ්‍යාලේඛනවලින් ඔබ්බෙහි, එහෙත් තරුණ සන්තානයන්හි අව්‍යාජ ව ම බලපෑ තත්ත්වයකි. විද්‍යමාන මිනුමකට හසු නො වන, එහෙත් කේවල පුද්ගලයකුගේ මතු නො ව සමස්ත සමාජ ක්‍රමයක දිශානතිය තීරණය කරන සංවේදී ප්‍රශ්න ඉතාමත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා මානව භාව ප්‍රකාශනයක් ලෙස 'කවිය' වැදගත් මිණුමක් වන්නේ එලෙස ය. එය පාඨක හෙවත් සහෘද මනසට ද වඩාත් සමීප මාධ්‍යයක් වෙයි.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

**ප්‍රාථමික මූලාශ්‍රය**

ඇම්බ්‍රෝස්, එම්. (2016). *ඔබ ගැඹුරු නින්දක.* සන්ථව ප්‍රකාශන.

කිතලගම, එල්. (2017). *කවුළු ඇස පාමුල.* සන්ථව ප්‍රකාශන.

කීර්ති, ටී. (2020). *ඒ ජෙට් එකේ ගියේ සමන්සිරිමයි.* සිළිකා ප්‍රකාශන.

කුඩාහෙට්ටි, බී. බී. (2010). *විදාරණය.* 21 වන සියවසේ ප්‍රකාශකයෝ.

කුඩාහෙට්ටි, බී. බී. (1972). *සින්ඩරෙල්ලා.* පහන් ප්‍රකාශන.

කුඩාහෙට්ටි, බී. බී. (1975). *සිරිමලුගේ නගා නලනී ය.* සුභාවි ප්‍රකාශන.

කුරුප්පුආරච්චි, එස්. (2015). *පස් කන්දක හුස්ම ගනිමි.* කර්තෘ ප්‍රකාශන, 2015.

කුරුප්පුආරච්චි, එස්. (2021). *මටත් දැන් ඒ පාර මතක නෑ සේකර.* සදර්ථ ප්‍රකාශන.

කොඩිතුවක්කු, පී. (1975). *අලුත් මිනිහෙක් ඇවිත්.* ඇස්. ගොඩගේ සහ සමාගම.

කොඩිතුවක්කු, පී. (2004). *ආලෝක මිනිසා.* සරසවි ප්‍රකාශන.

කොඩිතුවක්කු, පී. *පොඩි මල්ලියෙ.* (1972). එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගලප්පත්ති, බී. (1983). *දෙදෙනා ම දියණියෝ.* පියවි ප්‍රකාශන.

බන්දුජීව, ආර්. (2013). *මීළඟ මීවිත.* කර්තෘ ප්‍රකාශන.

මස්ඉඹුල, එම්. පී. (2011). *ඇහි පියන් ඇහැරිලා.* සන්ථව ප්‍රකාශන.

මස්ඉඹුල, එම්. පී. (2010). *හිරුත් හිම පියල්ලක.* සන්ථව ප්‍රකාශන.

රුවන්පතිරණ, එම්. (1974). *අංගුලිමාලගේ සිහිනය.* ප්‍රදීප ප්‍රකාශන.

රුවන්පතිරණ, එම්. (1975). *ඔබෙ යෙහෙළිය ඇය ගැහැනිය.* ප්‍රදීප ප්‍රකාශන.

රුවන්පතිරණ, එම්. (1972). *තහනම් දේශයකින්.* ප්‍රදීප ප්‍රකාශන.

ලියනගේ, එස්. එස්. (2014). *හැටේ වත්තේ මග්දලේනා.* කර්තෘ ප්‍රකාශන.

විජේසිංහ, ආර්. එස්. (1985). *වස්සානේ.* සමගි ප්‍රකාශන.

විජේසිංහ, ආර්. එස්. (1996). *සල් ගහ යට.* ඇස්. ගොඩගේ සමාගම.

හෙට්ටිආරච්චි, කේ. (2012). *සඳකත් මිණි ගඟුල පත්ලෙ.* කුමාර හෙට්ටිආරච්චි ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, කේ. (2019). *සරමිණි සුමුගුව.* කුමාර හෙට්ටිආරච්චි ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, කේ. (2013). *සාරා සංඛ්‍ය අග්නි වාෂ්ප.* සුරස ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, කේ. (1989). *රුවන් සක්මන්,* ප්‍රදීප ප්‍රකාශන.

**ද්විතීයික මූලාශ්‍රය**

අයිවන්, වී. (1993). *ප්‍රචණ්ඩත්වයේ අවිහිංසාව හා විප්ලවය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියසේන, එස්. (2000). *80 දශකයේ සිංහල තරුණ කැරැල්ලේ ප්‍රචණ්ඩ පසුබිම.* නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන පදනම, 2000.

කුමාර, ඩී. (1974). *තරුණ උගතුන්ගේ දේශපාලනය.* පරිවර්තක. සමරණායක, ඒ. ලංකා සමසමාජ පක්ෂය.

ගුණසිංහ, එන්. (1986). *අන්තෝනිඕ ග්‍රාම්ස්චි කෙටි හැඳින්වීමක්.* කම්කරු ගොවි ආයතනය.

ජයවර්ධන, කේ. (1986). *1975 - 85 දශක තුළ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී වාදය,* කාන්තා අධ්‍යයන මධ්‍යස්ථානය.

ජයවර්ධන, ඩබ්ලිව්. පී. පී. (1999). *අඩසියවසක දේශපාලන සටහන්.* ගම්පහ : කතෘ ප්‍රාකශන.

තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව (1990). *1 වැනි සැසි වාර්තාව.* ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව.

දිසානායක, ඩබ්ලිව්. (2004). *නව විචාර සංකල්ප.* විසිදුනු ප්‍රකාශකයෝ.

වෙනසක පැතිකඩ. (1995). *ශ්‍රී ලංකාවේ කාන්තාවන් - 1986-1995.* කාන්තා පර්යේෂණ කේන්ද්‍රය.

Althusser, L. (1971). *Lenin and philosophy and other essays.* Monthly Review Press.

Blyumin, I. G. (1957). *Theories Regulated Capitalism.* Foreign Languages Publishing House.

Carroll, W. K. (2006). Hegemony, counter-hegemony, anti-hegemony. *Socialist Studies/Études Socialistes*.

Freud, S. (1920). *Beyond the pleasure principle. Standard Edition* (Vol.18). Hogarth Press.

Gramsci, A. (1970). *Prison Notebooks.* International Publishes.

Gramsci, A. (1971). *Selections from the Prison Notebooks*. Quintin Hoare and Geoffrey Nowell Smith, Lawrence and Wishart.

Hebdige, D. (1979). Subculture: The Meaning of Style. Methuen & Co.Ltd.

Hettige, S. T. (Ed.). (1998). *Globalization, Social Change, and Youth*. German Cultural Institute and Centre Fo.

Jones, G. (2009). Youth. Cambridge: Polity. *Key Concepts for Understanding Curriculum*, *349*.

Kehily, M. J. (Ed.). (2007). *Understanding youth: Perspectives, identities & practices*. Sage Publications Ltd.

Zizek, S. (1960). *Living in the End Times,* Verso Books.